ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
இலங்கை சுற்றுலா மற்றும் ஹோட்டல் மேலாண்மை நிறுவனம்
Sri Lanka Institute of Tourism & Hotel Management

වාර්ෂික වාර්තාව
ஆண்டு அறிக்கை
ANNUAL REPORT
2022

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சு

Ministry of Tourism & Lands

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය

වාර්ෂික වාර්තාව 2022



අපගේ දැක්ම

ආසියාවේ සංචාරක හා ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ මානව සම්පත් සංවර්ධනය සඳහා අවශ්‍ය පුහුණුව හා අධ්‍යාපනය සපයන විශිෂ්ඨතම මධ්‍යස්ථානය බවට පත් වීම.

අපගේ මෙහෙවර

ආගන්තුක සත්කාරක සහ සංචාරක කර්මාන්තවල ඉල්ලීම් සපුරාලීම සඳහා, නිපුණ හා කැපවූ මානව සම්පත් බිහි කිරීම සඳහා ඉල්ලුම පදනම් කරගත් ජාත්‍යන්තර ප්‍රමිතියෙන් යුතු අධ්‍යාපනයක් සහ පුහුණුවක් ලබා දීම.

අපගේ තේමාව

"ශ්‍රී ලංකාව ගෝලීය අග්‍රස්ථානය කරා රැගෙන යාම – ශ්‍රී ලාංකීය ආගන්තුක සත්කාරක සේවය ලෝකය තුළ විශිෂ්ඨත්වය කරා ගමන් කරවීම."

අපගේ වටිනාකම්

- ✓ **ගුණාත්මකභාවය**
  අපගේ සිසුන්ට උසස් වටිනාකමක් ලබා දෙන පළමු පන්තිහේ හා අධ්‍යාපන වැඩසටහන් අපි ලබා දීම.
- ✓ **සාධාරණත්වය**
  ඉහලම ජයග්‍රහණයක් හා වර්ධනයක් සඳහා, සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ මානව සම්පත් පිළිබඳව ඇති ජාතික හා ජාත්‍යන්තර ප්‍රමිති අවශ්‍යතාවයන් සපුරාලීමට, සෑම ශ්‍රී ලාංකිකයකුටම සාධාරණ සහ එක සමාන අවස්ථා උදා කර දීමට අපි සහතික වීම.
- ✓ **අඛණ්ඩතාවය**
  සංචාරක හා සත්කාරක සේවා සඳහා මානව සම්පත් පුහුණු අවශ්‍යතා සපුරාලීමට, වෘත්තීමය අචාරධර්ම හා ශික්ෂාවන්හි ඉහළම ප්‍රමිතීන් අනුගමනය කිරීම.
- ✓ **තිරසාරත්වය**
  වගකීම් සහගත සහ තිරසර ආකාරයෙන් ආයතනික වර්ධනය සඳහා කටයුතු කිරීම.

අපගේ අරමුණු

- ➢ සංචාරක සහ ආගන්තුක සත්කාරක කර්මාන්තය සඳහා ඉහලම ගුණාත්මක වෘත්තිකයින් බිහි කිරීමට, සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තයේ පුහුණු සහ අධ්‍යාපනික වැඩසටහන් හඳුනා ගැනීම, නිර්මාණය කිරීම හා ලබා දීම.
- ➢ සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්ත සඳහා ඉහළම තත්ත්වයේ වෘත්තිකයන් බිහි කිරීම.
- ➢ සංචාරක හා ආගන්තුක සත්කාරක කර්මාන්තය තුළ නිරතුරුව වෙනස්වන හා අභියෝගාත්මක ප්‍රවණතා පිළිබඳව අවධානය යොමු කරමින්, සංචාරක හා සත්කාරක කර්මාන්තය තුල ඇති ඉල්ලුම සපුරාලීමට අවැසි ශ්‍රම බලකාය පුහුණු කිරීම.
- ➢ සංචාරක හා ආගන්තුක සත්කාර කර්මාන්තහේ තිරසාර වර්ධනයක් සහතික කරමින් රටේ විවිධ ප්‍රදේශවල ජීවත් වන සියළුම තරුණ තරුණියන් හට සාධාරණව සේවය කල හැකි පරිසරයක් නිර්මාණය කිරීම සහ සැමට සම අවස්ථා ලබා දීම.
- ➢ දේශීය හා ජාත්‍යන්තර අධ්‍යාපන ආයතන සමග අන්‍යෝන්‍ය වශයෙන් ඵලදායී ආකාරයකින් කටයුතු කිරීම තුළින් සංචාරක හා ආගන්තුක සත්කාරක අධ්‍යාපනය සැපයීහම් ශක්‍යතාවය පුළුල් කිරීම.
- ➢ සංචාරක හා ආගන්තුක සත්කාරක ක්ෂේත්‍රයේ පර්යේෂණ හරහා අන්තර්ජාතික දැනුම හා සම්බන්ධතාවයට එකතු වන විශිෂ්ඨත්වය ප්‍රදර්ශනය කිරීම.

පටුන

1. ආයතනයේ ප්‍රධාන කාර්යභාරය 4

2. ආයතනික තොරතුරු 5

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පළාත් පාසල්වල පිහිටීම 5

කළමනාකරණ මණ්ඩලය 6

විගණන සහ කළමනාකරණ කමිටු සාමාජිකයින් 7

අධ්‍යයන කටයුතු මණ්ඩලයේ සාමාජිකයින් 7

මූල්‍ය කමිටු සාමාජිකයින් 7

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය 8

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පාසල්වල විදුහල්පතිවරුන් 8

අංශ ප්‍රධානීන් 8

3. ආයතනික ව්‍යුහය 9

4. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය 10

4.1 භෞතික කාර්යසාධනය 2022 11

4.1.1 ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ කාර්යසාධනයේ විශේෂ අවස්ථා 11

4.1.2 පළාත් පාසල්වල කාර්යසාධනය 12

1. අනුරාධපුර පළාත් පාසල 12
2. බණ්ඩාරවෙල පළාත් පාසල 15
3. කොළඹ පළාත් පාසල 18
4. මහනුවර පළාත් පාසල 22
5. කොග්ගල පළාත් පාසල 25
6. රත්නපුර පළාත් පාසල 27
7. කුරුණෑගල පළාත් පාසල 30
8. මඩකලපුව පළාත් පාසල 33
9. යාපනය පළාත් පාසල 35

4.1.3 ප්‍රධාන කාර්යාලයේ අංශවල කාර්යසාධනය 37

1. ලේඛකාධිකාරී කාර්යාලය 37
2. මානව සම්පත් සහ පරිපාලන අංශය 38
3. මූල්‍ය අංශය 40
4. අලෙවිකරණ සහ මහජන සම්බන්ධතා අංශය 40
5. තොරතුරු තාක්ෂණ (IT) අංශය 41
6. පුස්තකාලය 42
7. අභ්‍යන්තර විගණන අංශය 42
8. සමුද්‍රා පුහුණු හෝටලය 43
9. ලොන්ඩ්‍රිය 43

5. මූල්‍ය ප්‍රකාශන 44

6. විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ 69

1. ආයතනයේ ප්‍රධාන කාර්යභාරය

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) යනු සත්කාරක සහ සංචාරක ක්ෂේත්‍රයේ තරුණ තරුණියන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ එකම රජය අනුමත ප්‍රමුඛතම ආයතනය වේ. එය 1964 දී ලංකා හෝටල් පාසල ලෙස ආරම්භ කරන ලද අතර වර්තමානයේ දී එය කළමනාකරණය කරනු ලබන්නේ සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය විසිනි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ප්‍රධාන කාර්යාලය, බස්නාහිර පළාත් පාසල සමඟ කොළඹ පිහිටුවා ඇත. දිවයින පුරා සිසුන් වෙත අධ්‍යාපනය ලබා දීමේ අරමුණින් පළාත් පාසල් අනුරාධපුර, බණ්ඩාරවෙල, මහනුවර, කොග්ගල, රත්නපුර, කුරුණෑගල, මඩකලපුව සහ යාපනය යන ප්‍රදේශවල පිහිටා ඇත.

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය මගින් පුහුණු සහ ඉහළ ම අභිප්‍රේරණයක් සහිත කළමනාකරණ වෘත්තිකයන් සමඟ දේශීය හා ජාත්‍යන්තර හෝටල් සහ සංචාරක ක්ෂේත්‍රවල ශීඝ්‍රයෙන් වෙනස් වන අවශ්‍යතා සපුරාලීම සඳහා මනා වෘත්තීය පුහුණුවක් ලබා දෙයි. මෙය සිදු කරනු ලබන්නේ රටේ දිනෙන් දින ප්‍රසාරණය වන සංචාරක සහ සත්කාරක ක්ෂේත්‍රයේ වර්ධනයන්ට ප්‍රතිචාරයක් වශයෙනි. ආරම්භක වසර දහය තුළ, පුහුණු වැඩසටහනේ මූලික අවධානය යොමු වූයේ සත්කාරක අංශය තුළ ඉහළ සහ මධ්‍යම කළමනාකරණ තනතුරු සඳහා පුද්ගලයින් පුහුණු කිරීම වන අතර, සත්කාරක ක්ෂේත්‍රය තුළ විවිධ ආයතනයන්හි ශ්‍රම බලකා ඉල්ලීම් සපුරාලීම සඳහා අතිරේක ශිල්පීය මට්ටමේ පාඨමාලා පිරිනැමීමයි.

වසර ගණනාවක් පුරා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් ශ්‍රී ලංකාවේ සහ ආසියාවේ කර්මාන්තය පුරා පවතින වෙනස් වන වෙළඳපොළ තුළ සිදුවන වෙනස්වීම් සහ අවශ්‍යතාවල නිශ්චිත අවශ්‍යතා සපුරාලීම සඳහා සිය වැඩසටහන් මනාව සකස් කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, කර්මාන්ත-විශේෂිත ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කිරීමට නව පුහුණු යෝජනා ක්‍රම නිරන්තරයෙන් ඉදිරිපත් කෙරේ. මෙම වැඩසටහන මඟින් "ප්‍රවේශ-පිටවීමේ" ස්ථාන කිහිපයක් ලබා දෙන අතර සිසුන්ට ඔවුන්ගේ පුහුණුව පිළිබඳ වරණයන්හි දී වැඩි නිදහසක් ලබා දෙනු ලබයි.

මීට අමතරව, එමගින් ප්‍රායෝගික ක්ෂේත්‍ර හා අදාළ අත්දැකීම් ඇති වෘත්තිමය සහතිකයක් හරහා තම දැනුම දියුණු කර ගැනීමට අදහස් කරනු ලබන පුද්ගලයන්ට වාසිදායක වන පෙර ඉගෙනුම් පිළිගනු ලබයි. ශ්‍රී ලකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ විවිධ පාඨමාලා මගින් සිසුන්ට ඔවුන්ගේ වෘත්තීය ගොඩනැගීම සඳහා විවිධ වූ අවස්ථාවන් සලසා දෙනු ලබයි.

ශිෂ්‍යයෙකුට ඔවුන්ගේ පූර්ව අධ්‍යාපනය, උනන්දුවක් දක්වන ක්ෂේත්‍රය, දැනුම සහ පවතින කුසලතා මත පදනම් ව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය වෙතින් පාඨමාලාවක් තෝරා ගත හැකිය. හෝටල් කළමනාකරණ පාඨමාලා ඔවුන්ගේ විවිධ විෂය මාලාව හරහා සිසුන්ට විශාල දැනුමක් ලබා දේ. සත්කාරක පාඨමාලා මගින් සිසුන්ට හෝටල් අංශය පිළිබඳව න්‍යායාත්මක වශයෙන් මෙන්ම ප්‍රායෝගිකව ද උගන්වයි. සිසුන් හෝටල් අංශයේ විවිධ කාර්යයන් අවබෝධ කර ගැනීමට උපකාර වන ප්‍රායෝගික දැනුම ලබා ගනී. මෙම ප්‍රායෝගික දැනුම මගින් ව්‍යාපාරික අංශයේ මෙහෙයුම් කටයුතු නිසියාකාරව හැසිරවීමට අපගේ පුහුණුව ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට මනා සේ ඉටු කිරීමේ හැකියාවක් ඇත. ශිල්පීය මට්ටමේ සුදුසුකම් සමඟ ම සිසුන් සහතික පත්‍ර පාඨමාලා සඳහා ද ඉදිරිපත් වන්නේ එමගින් ඔවුන්ගේ වෘත්තීය සුදුසුකම් තවදුරටත් වැඩි දියුණු කරගැනීම මගින් මෙම ක්ෂේත්‍රය තුළ ඔවුන්ගේ ස්ථාවරත්වය ගොඩනගා ගැනීමයි. එබැවින් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය එහි සිසු සිසුවියන් සඳහා වෘත්තීය හා අධ්‍යාපනික වශයෙන් වර්ධනය වීමට අපමණ අවස්ථාවන් සලසා දෙයි.

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ වසර ගණනාවක අත්දැකීම් මත සිය මාර්ගය සකසා ගැනීමට කටයුතු කිරීම සහ උසස් අධ්‍යාපනය හැදෑරීමට අමතරව, සත්කාරක ක්ෂේත්‍රයේ සිය වෘත්තීය ප්‍රගමනය සඳහා සිසුන්ට මාර්ග ගණනාවක් විවර වී ඇත.


2. ආයතනික තොරතුරු

සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ජාතියේ පුරෝගාමී සත්කාරක සහ සංචාරක අධ්‍යාපන සැපයුම්කරු වන ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) 1964 දී පිහිටුවන ලද ව්‍යවස්ථාපිත ආයතනයක් වන අතර 2005 අංක 38 දරන සංචාරක පනත මගින් නියාමනය කරනු ලැබේ. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය යනු ශ්‍රී ලංකාවේ සංචාරක හා ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම වෘත්තීය අධ්‍යාපන ආයතනයයි.

ලියාපදිංචි නාමය	:	ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
නෛතික ස්වරූපය	:	2005 අංක 38 දරන සංචාරක පනත යටතේ ස්ථාපිත රාජ්‍ය ආයතනයකි
ප්‍රධාන කාර්යාලයේ ලිපිනය	:	අංක 78, ගාලු පාර, කොළඹ - 03
විගණක	:	ශ්‍රී ලංකා විගණකාධිපති
බැංකුකරු	:	ලංකා බැංකුව

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පළාත් පාසල්වල පිහිටීම

- අනුරාධපුර පළාත් පාසල : ධර්මසිරි සේනානායක සංචාරක තොරතුරු මධ්‍යස්ථානය, ශ්‍රී මහා බෝධි මාවත, අනුරාධපුර
- බණ්ඩාරවෙල පළාත් පාසල : ජාතික නිවාඩු නිකේතනය, ගොල්ෆ් ලින්ක් පාර, බණ්ඩාරවෙල
- කොළඹ පළාත් පාසල : අංක 78, ගාලු පාර, කොළඹ - 03
- මහනුවර පළාත් පාසල : මහවැලි උයන, කුණ්ඩසාලේ, මහනුවර
- කොග්ගල පළාත් පාසල : කොග්ගල නිදහස් වෙළඳ කලාපය, හබරාදූව, කොග්ගල
- කුරුණෑගල පළාත් පාසල : මගුරුඔයවත්ත, බෝයගනේ, කුරුණෑගල
- රත්නපුර පළාත් පාසල : නව නගරය, රත්නපුර
- යාපනය පළාත් පාසල : රාජ්‍ය පරිපාලන විශ්‍රාම ශාලාව, කයිට්ස් පාර, යාපනය
- පාසිකුඩා පළාත් පාසල : ජාතික නිවාඩු නිකේතන කාර්යාලය, පාසිකුඩා (2022 මැයි පළමුවැනිදා සිට මඩකලපුවේ ස්ථානගත කරන ලදී)
- මඩකලපුව පළාත් පාසල : අංක. 07, සෙබස්තියන් වීදිය, අරසාඩි, මඩකලපුව (2022 මැයි පළමුවැනිදා සිට)



කළමනාකරණ මණ්ඩලය

2022 ජනවාරි සිට මැයි දක්වා

කිමාලි ප්‍රනාන්දු මිය : සභාපතිනිය

රාජ්‍ය අංශයේ නියෝජිතයන්

නදීකා වටලියද්ද මිය : අධ්‍යක්ෂ ජනරාල්, *ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය*
ඩී.එල්. සන්නසූරිය මිය : *සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය*
ධම්මිකා විජයසිංහ මෙනවිය : අධ්‍යක්ෂ ජනරාල්, *ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය*
එම්.කේ.පී.පී. සිරිවර්ධන මිය : කළමනාකරණ අධ්‍යක්ෂ, *ශ්‍රී ලංකා සංචාරක ප්‍රචර්ධන කාර්යාංශය*

පෞද්ගලික අංශයේ නියෝජිතයන්

ආචාර්ය දිනුෂාන් වන්නිආරච්චි
තිස්ස ගුණවර්ධන මහතා
බන්දුල ඒකනායක මහතා
ශිබානි ආර්. තම්බයියා මහත්මිය
ෂබ්රි බාහුදීන් මහතා
නිලාන් වික්‍රමසිංහ මහතා
අසේල වැවිට මහතා
පී.ඒ.එම්.බී. ප්‍රියාල් පෙරේරා මහතා

නිරීක්ෂකයන්

එම්.ඒ.එල්.එස්.එන්.කේ. මන්ත්‍රීනායක මහතා : නිරීක්ෂක, *විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය*
අරුණි පෙරේරා මහත්මිය : ලේකම්, *කළමනාකරණ මණ්ඩලය*

2022 ජූනි සිට දෙසැම්බර් දක්වා

ශිරන්ත පීරිස් මහතා : සභාපති

රාජ්‍ය අංශයේ නියෝජිතයන්

නදීකා වටලියද්ද මිය : අධ්‍යක්ෂ ජනරාල්, *(2022 ජනවාරි සිට ජූලි දක්වා)*
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
ජීවන්ති සේනානායක මෙනවිය : අධ්‍යක්ෂ ජනරාල්, *(2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා)*
ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය
උමා නිරංජන් මිය : *සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය*
ධම්මිකා විජයසිංහ මෙනවිය : අධ්‍යක්ෂ ජනරාල්, *(2022 ඔක්තෝබර් සිට නොවැම්බර් දක්වා)*
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
එම්.එල්. ගම්මන්පිල මහතා : අධ්‍යක්ෂ ජනරාල්, *(2022 නොවැම්බර් සිට දෙසැම්බර් දක්වා)*
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
එම්.කේ.පී.පී. සිරිවර්ධන මිය : කළමනාකරණ අධ්‍යක්ෂ, *ශ්‍රී ලංකා සංචාරක ප්‍රචර්ධන කාර්යාංශය*

පෞද්ගලික අංශයේ නියෝජිතයන්

අනුර ලොකුහෙට්ටි මහතා
බන්දුල ඒකනායක මහතා
එස්. හෙට්ටිආරච්චි මහතා
නිලාන් වික්‍රමසිංහ මහතා
අසේල වැවිට මහතා
පී.ඒ.එම්.බී. ප්‍රියාල් පෙරේරා

නිරීක්ෂකයන්

එම්.ඒ.එල්.එස්.එන්.කේ. මන්ත්‍රීනායක මහතා : නිරීක්ෂක, *විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය*
අරුණි පෙරේරා මහත්මිය : ලේකම්, *කළමනාකරණ මණ්ඩලය*

විගණන සහ කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්

සභාපති	:	සම්පත් මන්ත්‍රීනායක මහතා, *අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය*
සාමාජික	:	ප්‍රියාල් පෙරේරා මහතා, *ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ කළමනාකරණ මණ්ඩල සාමාජික*
සාමාජික	:	බන්ධුල ඒකනායක මහතා, *ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ කළමනාකරණ මණ්ඩල සාමාජික*
නිරීක්ෂක	:	පී. ලුරෙන්තරන් මහතා, *ප්‍රධාන අභ්‍යන්තර විගණක, සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය*
නිරීක්ෂක	:	ටී. ඉඹුල්දෙණිය මෙනවිය, *විගණන අධිකාරී, විගණකාධිපති දෙපාර්තමේන්තුව*
කැඳවුම්කරු	:	ඩබ්ලිව්.එම්.පී. ධනුසේකර මහතා, සහකාර අධ්‍යක්ෂ, අභ්‍යන්තර විගණන

අධ්‍යයන කටයුතු මණ්ඩලයේ සාමාජිකයින්

නදීකා වටලියද්ද මහත්මිය	: සභාපතිනිය	*(2022 ජනවාරි සිට ජූලි දක්වා)*
ජීවන්ති සේනානායක මෙනවිය	: සභාපතිනිය	*(2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා)*
මහාචාර්ය වසන්ති අරසරත්නම්	: සාමාජික	
මහාචාර්ය ආර්.ඒ.සී. ජයලත්	: සාමාජික	
ඩී.එල්. සන්නසූරිය මිය	: සාමාජික	
පැට්‍රික් ජී.ඒස්. පෙරේරා මහතා	: සාමාජික	
කනිෂ්ක ජයතුංග මහතා	: ලේකම්/කැඳවුම්කරු	

මූල්‍ය කමිටුවේ සාමාජිකයන්

නදීකා වටලියද්ද මහත්මිය	: සභාපතිනිය	*(2022 ජනවාරි සිට ජූලි දක්වා)*
ජීවන්ති සේනානායක මෙනවිය	: සභාපතිනිය	*(2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා)*
ප්‍රියාල් පෙරේරා මහතා	: අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	
එක්සත් විජේරත්න මහතා	: අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	
ආර්.එම්.ඒන්.කේ.කේ. අබේරත්න මෙනවිය	: ප්‍රධාන ගණකාධිකාරී, *සංචාරක අමාත්‍යාංශය*	
රොයිස් ප්‍රනාන්දු මහතා	: අධ්‍යක්ෂ මූල්‍ය, කැඳවුම්කරු සහ ලේකම්	

ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්වය

කිමාලි ප්‍රනාන්දු මිය	: සභාපතිනිය	*(2022 ජනවාරි සිට මැයි දක්වා)*
ශිරන්ත පීරිස් මහතා	: සභාපති	*(2022 ජූනි සිට දෙසැම්බර් දක්වා)*
නදීකා වටලියද්ද මහත්මිය	: අධ්‍යක්ෂ ජනරාල්	*(2022 ජනවාරි සිට ජූලි දක්වා)*
ජීවන්ති සේනානායක මෙනවිය	: අධ්‍යක්ෂ ජනරාල්	*(2022 සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා)*
කණිෂ්ක ජයතුංග මහතා	: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන)	*(2022 සැප්තැම්බර් සිට)*
සංජය කාරියවසම් මහතා	: නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අනධ්‍යයන)	
රොයිස් ප්‍රනාන්දු මහතා	: අධ්‍යක්ෂ - මූල්‍ය	
අමිතා ඕවිට්පාන මහත්මිය	: නියෝජ්‍ය අධ්‍යක්ෂ - මානව සම්පත් සහ පරිපාලන	
හර්ෂණ පොන්නම්පෙරුම මහතා	: කළමනාකරු - සමුද්‍රා හෝටලය	
අයාල් පෙරේරා මහතා	: සහකාර ලේඛකාධිකාරී	
දිල්රුවන් රත්නායක මහතා	: සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ	
තාරක ගමගේ මහතා	: සහකාර අධ්‍යක්ෂ - නඩත්තු ඉංජිනේරු	
සාගර කුලසිංහ මහතා	: සහකාර අධ්‍යක්ෂ - අලෙවි	
ගංගා වල්පොල මහත්මිය	: පුස්තකාලයාධිපති	
නිරන්සන් කුමාර් මහතා	: සහකාර අධ්‍යක්ෂ - ප්‍රසම්පාදන	
එලේනා පෙරේරා මහත්මිය	: සහකාර අධ්‍යක්ෂ - මූල්‍ය	*(2022 ජනවාරි සිට නොවැම්බර් දක්වා)*


ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ පාසල්වල විදුහල්පතිවරුන්

ලාල් සෙනෙවිරත්න මහතා	: අනුරාධපුරය	
චමින්ද තෙන්නකෝන් මහතා	: බණ්ඩාරවෙල	
සමන් හතුරුසිංහ මහතා	: කොළඹ	
කුමුදුනී වික්‍රමසිංහ මහත්මිය	: මහනුවර	
ආචාර්ය ආර්.ඩී.ඒ. ලෙනාඩ් රංවාගොඩ	: කොග්ගල	
රියන්සි ජයවර්ධන මහතා	: කුරුණෑගල	
කනිෂ්ක එන්. ජයතුංග මහතා	: රත්නපුර	*(2022 ජනවාරි සිට අගෝස්තු දක්වා)*
කනිෂ්ක නුගවෙල මහතා	: රත්නපුර (භාර කථිකාචාර්ය)	*(2022 සැප්තැම්බර් සිට)*
රිසාන් මොහොමඩ් මහතා	: පාසිකුඩා / මඩකලපුව (භාර කථිකාචාර්ය)	
නිරංජලා ඇලෙක්ස් මහත්මිය	: යාපනය (භාර කථිකාචාර්ය)	

අංශ ප්‍රධානීන්

නිශාන්ත කුලතුංග මහතා	: වෘත්තීය සූප ශාස්ත්‍ර අංශය	
ඩික්සන් කුමාර මහතා	: ආහාර සහ පාන මෙහෙයුම් අංශය	
උදේන සිල්පතිලක මහතා	: ඉදිරි කාර්යාල මෙහෙයුම් අංශය	
ලෙනාඩ් පෙරේරා මහතා	: හෝටල් ගෘහ පාලන අංශය	
ධීර හෙට්ටිආරච්චි මහතා	: සංචරණය හා සංචාරක අංශය	

3. ආයතනික ව්‍යුහය



	අධ්‍යක්ෂ ජනරාල්	නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්	අධ්‍යක්ෂ	විදුහල්පති	ජෙ.ක. (AR 2)	ස. ක (AR 1)	ස.අ. (MM)	කා. කා. (E/A)	කා. කා. (JM 1-2)	කා.ස (2-2)	කා.ස (1-2)	කා.ස (PL3)	කා.ස (PL2)	කා.ස (PL1)	එකතුව
ශ්‍රී.ල.ස.හා.හෝ.කා.ආ.	01	02	02	07	21	60	09	04	12	01	38	12	05	21	195
සම්බුද්ධ හෝටලය	-	-	-	-	-	-	01	-	02	-	03	02	10	09	27
එකතුව	01	02	02	07	21	60	10	04	14	01	41	14	15	30	222

4. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය

වෙළඳපොළ ආර්ථිකය තුළ, ආයතනික මූල්‍යයන් නිසැකවම සීමිත වූ ප්‍රධාන සම්පත් වලින් එකකි. මූල්‍ය සම්පත් සීමිත වීම මෙහෙයුම් කිහිපයක (අත්පත් කර ගැනීම, ප්‍රවර්ධනය, බෙදා හැරීම සහ විකුණුම්) සීමාවන්ට බලපායි. එබැවින්, මූල්‍ය වත්කම් නිසි ලෙස වෙන් කිරීම නූතන ව්‍යාපාරයක සුවිශේෂ ස්ථානයක් ගනී. සමාගම තම අරමුදල් වෙන් කළ යුතු ආකාරය පිළිබඳ අවසන් තීරණය ගැනීම මනා තක්සේරුවක් මත පදනම් විය යුතු අතර, එය අතීත කාර්යසාධනය විශ්ලේෂණය මත රඳා පවතී. මූල්‍ය විශ්ලේෂණවල වඩාත් සුලභ සහ බහුලව භාවිතා වන ක්‍රමයක් වන්නේ මූල්‍ය ප්‍රකාශන විශ්ලේෂණය සහ අනුපාත විශ්ලේෂණයයි.

සරල ගණිතමය සූත්‍රයක් හරහා අන්‍යෝන්‍ය සම්බන්ධතාවකින් මූල්‍ය ප්‍රකාශනවලින් ඇතැම් අයිතම සැලකීම මගින්, මුදල් හරහා මනිනු ලබන සමාගමේ සමස්ත කාර්යසාධනය තීරණය කළ හැකිය.

කොවිඩ්-19 වසංගත තත්ත්වය ගෝලීය වසංගතයක් දක්වා වර්ධනය වීමත් සමඟ, ලෝකය මේ වන විට ගෝලීය සෞඛ්‍ය, සමාජීය සහ ආර්ථික හදිසි අවස්ථාවකට මුහුණ දී සිටින අතර අගුලු දැමීම්, සංචරණය සීමා කිරීම්, ගුවන් තොටුපළ වසා දැමීම් සහ දේශසීමා වසා දැමීම් වැනි දැඩි පාලන පියවරයන් සමඟ සංචාරක සහ සත්කාරක ක්ෂේත්‍රය වඩාත් දරුණු ලෙස බලපෑමට ලක්වූ ක්ෂේත්‍රයක් බවට පත් ව ඇත.


කළමනාකරණයේ ප්‍රධාන වගකීම් වලින් එකක් වන්නේ තීරණ ගැනීමයි. ආයතනික කාර්යසාධනය විශ්ලේෂණය කිරීම සඳහා පාර්ශ්වකරුවන් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් ගනු ලබන තීරණවල සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය ගණනය කිරීම අවශ්‍ය වේ.

4.1 2022 දී භෞතික කාර්යසාධනය

4.1.1 ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ කාර්යසාධනයේ විශේෂ අවස්ථා

වගුව 01. පසුගිය වසර පහ තුළ (2018 සිට 2022 දක්වා) පාඨමාලා සම්පූර්ණ කළ සිසුන් සංඛ්‍යාව

පාසල	වසර				
	2018	2019	2020	2021	2022
කොළඹ	815	1056	508	1,650	3,534
අනුරාධපුර	190	374	143	81	396
බණ්ඩාරවෙල	253	495	193	225	313
මහනුවර	562	641	228	360	519
කෝග්ගල	651	909	501	265	643
කුරුණෑගල	454	538	304	274	419
රත්නපුරය	327	465	198	290	395
පාසිකුඩා/මඩකලපුව	51	74	37	36	36
යාපනය	12	23	36	126	40
එකතුව	**3,315**	**4,575**	**2,148**	**3,307**	**6,295**



ඉහත වගුව සහ තීරු ප්‍රස්ථාරය 2018 සිට 2022 දක්වා ශිෂ්‍ය සංඛ්‍යාව ප්‍රදර්ශනය කරයි. පවත්වනු ලබන මාර්ගගත වැඩසටහන් සමඟින්, කොවිඩ්-19 වසංගතය තුළ පවා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ ශිෂ්‍ය සංඛ්‍යාවේ ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කර ඇත.

4.1.2 පළාත් පාසල්වල කාර්යසාධනය

1. අනුරාධපුර පළාත් පාසල



ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ අනුරාධපුරය පළාත් පාසල 1992 දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ජාතික නිවාඩු නිකේතනයේදී ආරම්භ කරන ලදී. මෙම පාසල මගින් ආරම්භයේ දී පිරිනමනු ලැබුවේ මූලික මට්ටමේ - හෝටල් පිළිගැනීම සහ හෝටල් ගෘහ පාලනය පාඨමාලා පමණි. 1996 සිට, මූලික මට්ටමේ වෘත්තීය සූපවේදය සහ ආපනශාලා සහ බීමහල් පාඨමාලා පිරිනමන ලදී. 2005 දී පාසල වර්තමාන ගොඩනැගිල්ලට ගෙන යන ලදී. මෙම පළාත් පාසල උතුරු මැද පළාතේ පාර්ශවකරුවන් සඳහා පිහිටුවා තිබුණ ද කුරුණෑගල, පුත්තලම, හලාවත, කුලියාපිටිය, ආදී අවට දිස්ත්‍රික්කවල ජනතාවට ද එය සේවය ලබා දේ.

<u>පවතින පහසුකම්</u>

- ✓ දේශන ශාලා 04 (උපරිම සිසුන් සංඛ්‍යාව 30 බැගින්)
- ✓ පුහුණු මුළුතැන්ගෙය 01
- ✓ පුහුණු ආපනශාලා 01
- ✓ මොක්අප් කාමර (Mock-up Room) 01
- ✓ පරිගණක විද්‍යාගාර 01
- ✓ ලොකර් කාමර 01

<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

විදුහල්පති: පී.ජේ ද අල්විස් සෙනෙවිරත්න මහතා


අංශය	දේශකවරයාගේ නම	තනතුර
වෘත්තීය සූපවේදය	එන්.එම්. දිසානායක මහතා	සහකාර කථිකාචාර්ය
	එම්.එන්. ප්‍රනාන්දු මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර සහ පාන මෙහෙයුම්	ආර්.එම්.ඒ.පී. රත්නායක මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	ජී.පී.එම්. ගමගේ මහතා	සහකාර කථිකාචාර්ය

සටහන: *මීට අමතරව, අනුරාධපුර ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ බාහිර කථිකාචාර්යවරුන් 12 දෙනෙක් සේවය කරන ලදී.*

2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

වගුව 03: 2021 සහ 2022 දී අනුරාධපුර පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	14	31
	අවන්හල් සහ බීමහල් සේවා	04	43
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	-
	හෝටල් ගෘහ පාලනය	-	32
උප එකතුව - ශිල්පීය මට්ටම		**18**	**106**
ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සූපවේදය	-	13
	අවන්හල් සහ බීමහල් සේවා	-	05
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	-
	හෝටල් ගෘහ පාලනය	-	03
උප එකතුව - ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)		**-**	**21**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	20	64
	ආහාර සහ පාන මෙහෙයුම්	08	48
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	06	42
	හෝටල් ගෘහ පාලනය	09	-
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**43**	**167**
පේස්ට්‍රි සහ බේකරි පාඨමාලාව		**-**	30
ආදායම් උත්පාදන වැඩසටහන්		20	45
මුළු එකතුව		**81**	**369**



අනුරාධපුර පළාත් පාසලේ පාඨමාලා හැදෑරූ සිසුන් සංඛ්‍යාව 2021 සහ 2022 අතර කාලයේ දී 81 සිට 369 දක්වා වැඩි විය.

2022 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධන වැඩසටහන්

- පණ්ඩුලගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සංවිධානය කරන ලද රැකියා පොළට සහභාගී වන ලදී.
- තිරප්පනේ මහානාම විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන පහළගම වින්ග් - තඹුත්තේගම ප්‍රදේශයේ පවත්වන ලදී.
- අනුරාධපුර ස්වර්ණපාලි බාලිකා මහා විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- අනුරාධපුර ශාන්ත ජෝසප් විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ගල්පොතේගම මහා විද්‍යාලය දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- උතුරු මැද පළාතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මහජන සෞඛ්‍ය නිලධාරීන් සඳහා මේස හැසිරීම් (Table etiquettes) සහ ආචාර විධි වැඩසටහනක් පවත්වන ලදී.
- දොන් බොස්කෝ ආයතනය සඳහා මේස හැසිරීම් සහ ආචාර විධි වැඩසටහනක් පවත්වන ලදී.
- ධම්මදින්න මහා විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- කහටගස්දිගිලිය සද්ධානිස්ස මහා විද්‍යාලය දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- මැදවච්චිය මෛත්‍රීපාල සේනානායක මධ්‍ය මහා විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- අනුරාධපුර පොතානේගම මහා විද්‍යාලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

2022 දී පවත්වන ලද ආදායම් උත්පාදන වැඩසටහන්

- අනුරාධපුර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 40 දෙනෙකු සඳහා එක් දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- සංචාරක රියදුරන් 28 දෙනෙකු සඳහා දින හතරක සංචාරක රියදුරන්ගේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- සංචාරක රියදුරන් 33 දෙනෙකු සඳහා දින හතරක සංචාරක රියදුරන්ගේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

2022 දී සංවිධානය කරන ලද අනෙකුත් විශේෂ ක්‍රියාකාරකම්

- ශිෂ්‍ය ක්‍රීඩා සහ සුබසාධන සංගමය විසින් සංවිධානය කරන ලද ශ්‍රමදාන ව්‍යාපාරය විද්‍යාල පරිශ්‍රයේ දී පවත්වන ලදී.
- ශිෂ්‍ය ක්‍රීඩා සහ සුභසාධක සංගමය විසින් සංවිධානය කරන ලද ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ශිෂ්‍ය ක්‍රීඩා සහ සුබසාධන සංගමය විසින් සංවිධානය කරන ලද ප්‍රථමාධාර වැඩසටහනක් පවත්වන ලදී.
- ශිෂ්‍ය ක්‍රීඩා සහ සුබසාධන සංගමය විසින් සංවිධානය කරන ලද "කාන්තා දිනය 2022" සැමරීම.
- ශිෂ්‍ය ක්‍රීඩා සහ සුභසාධක සංගමය විසින් සංවිධානය කරන ලද 'හෙරිටන්ස් කණ්ඩලම' සහ 'හබරණ ලොජ්' වෙත හුරුපුරුදු කරවීම් / අධ්‍යාපන චාරිකාව.
- ක්‍රීඩා සහ සුභසාධක සංගමය විසින් සංවිධානය කරන ලද සිංහල සහ දෙමළ අලුත් අවුරුදු උත්සවය පවත්වන ලදී.
- ක්‍රීඩා සහ සුභසාධක සංගමය විසින් සංවිධානය කරන ලද අන්තර් පන්ති කැරම් තරඟාවලිය පවත්වන ලදී.
- ක්‍රීඩා සහ සුභසාධක සංගමය විසින් සංවිධානය කරන ලද අන්තර් පන්ති ක්‍රිකට් තරඟාවලිය පවත්වන ලදී.
- 2022 ලෝක සංචාරක දිනය සැමරීම සඳහා රුක් රෝපණ ව්‍යාපාරයක් සංවිධානය කරන ලදී.
- අනුරාධපුර සංචාරක හෝටල් හිමියන්ගේ සංගමය සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් සිසිල උයන හෝටලයේ සංවිධානය කරන ලද 2022 ලෝක සංචාරක දිනයට සහභාගී වන ලදී.
- ශිල්පීය මට්ටමේ සිසුන් සඳහා බැහැරගත පුහුණු වැඩසටහනක් සහ දිවා ආහාරය සංවිධානය කරන ලදී.

2. බණ්ඩාරවෙල පළාත් පාසල



බණ්ඩාරවෙල ප්‍රථම පළාත් පාසල 1999 වසරේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ආරම්භ කරන ලද අතර පසුව ඌව පළාත් සභාව මගින් නව පාසල් ගොඩනැගිල්ලක් ඉදිකරන ලදී. වත්මන් ආයතනය 2004 වර්ෂයේදී එම ස්ථානයේ ස්ථාපිත කර පවත්වාගෙන යනු ලබයි.

පවතින පහසුකම්

- ✓ දේශන ශාලා 05
- ✓ පුහුණු ආපනශාලා 01
- ✓ පුහුණු මුළුතැන්ගෙය 01
- ✓ මොක්අප් කාමර (Mock-up Room) 02
- ✓ පරිගණක විද්‍යාගාර 01
- ✓ පුස්තකාල 01
- ✓ ශ්‍රවණාගාර 01

අධ්‍යයන කාර්ය මණ්ඩලය

විදුහල්පති : චමින්ද තෙන්නකෝන් මහතා


අංශය	දේශකවරයාගේ නම	තනතුර
වෘත්තීය සූපවේදය	ආර්. බණ්ඩාර වෙත්තසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	ඊ.එල්.කේ. පෙරේරා මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර සහ පාන මෙහෙයුම්	සංජීව එල්ලාවල මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	චමිලා රත්නායක මෙනවිය	සහකාර කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	සී.පී. හෙට්ටිආරච්චි මහතා	සහකාර කථිකාචාර්ය

සටහන: *තවද, බණ්ඩාරවෙල පළාත් පාසලේ බාහිර කථිකාචාර්යවරුන් 09 ක් සේවය කරන ලදී.*

2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

වගුව 04: 2021 සහ 2022 දී බණ්ඩාරවෙල පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	13	24
	අවන්හල් සහ බීමහල් සේවා	01	16
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	02	-
	හෝටල් ගෘහ පාලනය	-	-
උප එකතුව - ශිල්පීය මට්ටම		**16**	**40**
ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සූපවේදය	30	39
	අවන්හල් සහ බීමහල් සේවා	01	44
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	01	-
	හෝටල් ගෘහ පාලනය	04	-
උප එකතුව - ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)		**36**	**83**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	51	72
	ආහාර සහ පාන මෙහෙයුම්	59	51
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	33	31
	හෝටල් ගෘහ පාලනය	30	38
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**173**	**192**
මුළු එකතුව		**225**	**313**



බණ්ඩාරවෙල පළාත් පාසලේ පාඨමාලා සඳහා පුහුණු වූ සිසුන් සංඛ්‍යාව 2021 සහ 2022 වර්ෂවල 225 සිට 315 දක්වා වූ වර්ධනයක් පෙන්නුම් කර ඇත.

2022 දී පවත්වන ලද ව්‍යක්තීය සංවර්ධන වැඩසටහන්

- සැප්තැම්බර් 16 සහ 20 යන දිනයන්හිදී සබරගමුව විශ්වවිද්‍යාලයේ සිසුන් සඳහා වැඩමුළුවක් පවත්වන ලදී.
- 2022 ජාතික ඔලිම්පික් ඇකඩමි සැසිය - 2022 දෙසැම්බර් 2 සහ 3 යන දිනවල පවත්වන ලදී.

2022 දී පවත්වන ලද වෙනත් විශේෂ වැඩසටහන්

- 2022 පෙබරවාරි 08 වැනි දින පාසලේදී පවත්වන ලද ශ්‍රමදාන ව්‍යාපාරය සහ රුක් රෝපණ වැඩසටහන් පවත්වන ලදී..
- 2022 මාර්තු 25 වන දින ශිෂ්‍ය සුභසාධක සංගමය විසින් පවත්වන ලද ක්‍රිකට් තරඟාවලිය පවත්වන ලදී.
- 2022 අප්‍රේල් 25 වැනි දින පාසලේ සිසුන් සඳහා ධිෂ්‍යන්ත් මහතා විසින් පවත්වන ලද ආරාධිත දේශනය.
- 2022 අගෝස්තු 10 වන දින උපාලි නන්දසිරි මහතා විසින් මෙහෙයවන ලද "ගීතයෙන් ජීවිතය දකිමු" දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- බණ්ඩාරවෙල මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් 23 දෙනකු දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- බණ්ඩාරවෙල/දෝව මහා විද්‍යාලයේ සිසු සිසුවියන් 30 දෙනකු දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- 2022 නොවැම්බර් 28 වැනි දින පාසලේ සිසුන් සඳහා පවත්වන ලද ආරාධිත දේශනයක් පවත්වන ලදී.
- ව්‍යක්තීය පුහුණු අධිකාරිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - බණ්ඩාරවෙල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හපුතලේ, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ඇල්ල, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කැන්දකැටිය, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කතරගම දී පිළිවෙළින් 2022 ජනවාරි 5, ජනවාරි 19, පෙබරවාරි 7, මාර්තු 14, 15 සැප්තැම්බර් 15 යන දිනවල පවත්වන ලද රැකියා පොළවල් පවත්වන ලදී.
- 2022 මාර්තු 12 වන දින මහියංගණය ජාතික පාසලේ ශිෂ්‍ය නායක සිසුන් සඳහා පවත්වන ලද පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- 2022 මාර්තු 25 වන දින සියලුම කාර්ය මණ්ඩලය සහ සිසුන් සඳහා පවත්වනු ලබන ක්‍රිකට් තරඟාවලිය පවත්වන ලදී.
- බදුල්ල ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශයේ බංගලා භාරකරුවන් සඳහා පවත්වනු ලබන පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

3. කොළඹ පළාත් පාසල



ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) කලින් ලංකා හෝටල් පාසල (Ceylon Hotel School) ලෙස හැඳින්වූ අතර 1966 දී පාර්ලිමේන්තු පනතක් මගින් තරුණ තරුණියන්ට සංචාරක ව්‍යාපාරය පුහුණු කිරීම සඳහා පිහිටුවන ලද අතර එය කළමනාකරණය කරනු ලැබුවේ ලංකා සංචාරක මණ්ඩලය විසිනි. එය මුලින් පිහිටා තිබුණේ කොළඹ පාර්ක් වීදියේ ය. එය 1980 දී ගල්කිස්ස පාම් බීච් හෝටලයට සහ 1994 දී නාවල වෙත ගෙන යන ලදී. 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ ලංකා හෝටල් පාසල ශ්‍රී ලංකා සංචාරක හා සත්කාරක කළමනාකරණ ආයතනය බවට පත් කිරීම සිදු කරන ලදී. වර්තමානයේ ආයතනය කර්මාන්තයේ ඉල්ලුමට සරිලන පරිදි බොහෝ පාඨමාලා සැලසුම් කර ඇත. ශිල්පීය, සහතිකපත්‍ර, අන්තර්මධ්‍ය, උසස්, කළමණාකරණ ඩිප්ලෝමා, ජාතික සංචාරක මාර්ගෝපදේශ සහ සංචාරක රියදුරු මාර්ගෝපදේශ පාඨමාලා පවත්වා ඇත. මීට අමතරව, එය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ වෙනත් විවිධ ආයතන සඳහා කෙටි කාලීන පුහුණු වැඩසටහන් ද පවත්වයි. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය අංක 78, ගාලු පාර, කොළඹ-03 හි පිහිටා ඇති අතර, එහි මෙහෙයුම් 2000 අගෝස්තු 15 වන දින ආරම්භ කරන ලදී.

<u>පවතින පහසුකම්</u>

- ✓ දේශන ශාලා 23
- ✓ පුහුණු ආපනශාලා 02
- ✓ මොක්අප් (Mock-up) කාමර 02
- ✓ පුහුණු මුළුතැන්ගෙවල් 04
- ✓ පරිගණක විද්‍යාගාර 01
- ✓ පුස්තකාල 01
- ✓ භෝජනාගාර 01

<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

විදුහල්පති : සමන් හතුරුසිංහ මහතා


අංශය	දේශකවරයාගේ නම	තනතුර
වෘත්තීය සූපවේදය	නිශාන්ත කුලතුංග මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - අංශ ප්‍රධානී
	එච්.එම්.බී. ලංකාපුර බණ්ඩාර මහතා	සහකාර කථිකාචාර්ය
	වයි.බී.එම්.ආර්. යාපාබණ්ඩාර මහතා	සහකාර කථිකාචාර්ය
	එච්.එම්.ටී. හේරත් මහතා	සහකාර කථිකාචාර්ය
	එස්.ඒ.එන්. විරාජ් මහතා	සහකාර කථිකාචාර්ය
	එම්.එන්. විරංග මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර සහ පාන මෙහෙයුම්	එම්.කේ. ඩික්සන් කුමාර මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - අංශ ප්‍රධානී
	වාමන් පෙරේරා මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	කාංචන ක්‍රිෂාන්ත මහතා	සහකාර කථිකාචාර්ය
	දර්ශන ජයසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	තරින්ද වීරරත්න මහතා	සහකාර කථිකාචාර්ය
	එච්.එම්.පී. මංජුල මහතා	සහකාර කථිකාචාර්ය
පේස්ට්‍රි සහ බේකරි	එම්.ඩී. රුවන්ත ප්‍රසාද් මහතා	සහකාර කථිකාචාර්ය
	පී.සී. පිනිදිය මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	යූ.පී. සිල්පතිලක මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - අංශ ප්‍රධානී
	ඩී.ටී. සේනාරත්න මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	නලින් කහටපිටිගම මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	ඩබ්ලිව්.එන්.බී. මෙන්ඩිස් මහත්මිය	සහකාර කථිකාචාර්ය
	සී.ටී. ගුණසේකර මහත්මිය	සහකාර කථිකාචාර්ය
ගෘහ පාලන මෙහෙයුම්	ඒ.එල්.ඩී.එල්. පෙරේරා මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - අංශ ප්‍රධානී
	නාමල් මුහන්දිරම්ගේ මහතා	සහකාර කථිකාචාර්ය
	ඒ.ආර්. ජයසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	ඒ.එම්.කේ.ඩබ්ලිව්.කේ. අබේකෝන් මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
සංචරණ සහ සංචාරක කළමනාකරණය	සුජිත් යමසිංහ මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	පී.එම්. සුරවීර මහතා	සහකාර කථිකාචාර්ය - අංශ ප්‍රධානී
	ධීර හෙට්ටිආරච්චි මහතා	සහකාර කථිකාචාර්ය
	අනුර ශාන්ත මහතා	සහකාර කථිකාචාර්ය
ඉංග්‍රීසි / භාෂා මධ්‍යස්ථානය	ලතීෂා රාමනායක මහත්මිය	සහකාර කථිකාචාර්ය

සටහන: *නවද, කොළඹ පළාත් පාසලේ බාහිර කථිකාචාර්යවරුන් 27 දෙනෙකු සේවය කරන ලදී.*

2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

වගුව 05: 2021 සහ 2022 දී කොළඹ පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	52	34
	අවන්හල් සහ බීමහල් සේවා	09	29
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	09	-
	හෝටල් ගෘහ පාලනය	07	-
උප එකතුව - ශිල්පීය මට්ටම		**77**	**63**
ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සූපවේදය	32	37
	අවන්හල් සහ බීමහල් සේවා	60	35
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	47	21
	හෝටල් ගෘහ පාලනය	50	34
උප එකතුව - ශිල්පීය මට්ටම		**189**	**127**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	70	73
	ආහාර සහ පාන මෙහෙයුම්	74	73
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	94	79
	හෝටල් ගෘහ පාලනය	66	72
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**304**	**297**
අන්තර්මධ්‍ය මට්ටම	වෘත්තීය සූපවේදය	46	11
	ආහාර සහ පාන මෙහෙයුම්	51	12
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	39	03
	හෝටල් ගෘහ පාලන මෙහෙයුම්	40	12
උප එකතුව - අන්තර්මධ්‍ය මට්ටම		**176**	**38**
උසස් මට්ටම	වෘත්තීය සූපවේදය	16	18
	ආහාර පාන	19	25
	නවාතැන් සැපයුම් මෙහෙයුම්	12	30
උප එකතුව - උසස් මට්ටම		**47**	**73**
කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (තුන් අවුරුදු)		53	45
පේස්ට්‍රි සහ බේකරි (මාස 3)		57	-
පේස්ට්‍රි සහ බේකරි සහතිකපත්‍ර පාඨමාලාව (මාස 5)		-	69
ජාතික සංචාරක මාර්ගෝපදේශ වැඩසටහන		214	67
සංචාරක රියදුරු මාර්ගෝපදේශ වැඩසටහන		118	66
සංචාරක මාර්ගෝපදේශ නවමුව (refresher) වැඩසටහන		76	34
සංචාරක මාර්ගෝපදේශ පුහුණු වැඩසටහන (ජාතික සහ රියදුරු)		-	327
සංචාරක රියදුරු වැඩසටහන		176	1391
සංචාරක රියදුරු නවමුව (refresher) වැඩසටහන		-	347
ලියදිරිය වැඩසටහන – (රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයෙන් (PPP) කොළඹ හිල්ටන් හෝටලය සමග)		15	-
ආධුනිකත්ව වැඩසටහන		112	-
සකස් කළ වැඩසටහන (Trailor Made)		92	515
සහතික කළ සත්කාරක මූල්‍ය සහ කළමනාකරණය (CMA සමග රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්වයෙන්)		20	-
ආදායම් උත්පාදන වැඩසටහන - පේස්ට්‍රි සහ බේකරි වැඩසටහන (සති අන්තය)		-	75
මුළු එකතුව		**1,650**	**3,534**



කොළඹ පළාත් පාසලේ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන පාඨමාලාවල පුහුණුව ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව 2021 දී 1650 ක් වූ අතර 2022 දී 3,534 ක් විය.

2022 දී පවත්වන ලද අනෙකුත් වැඩසටහන්

භාෂා ඒකකය;

- සියලුම සිසුන් සඳහා භාෂා දිනය 2022 මාර්තු 4 වන දින පවත්වන ලදී.
- උසස් පෙළ සිසුන් සඳහා (338 කණ්ඩායම) අනුමණ්ඩල සාකච්ඡා 2022 නොවැම්බර් 1 වැනි දින පවත්වන ලදී.
- කළමනාකරණය 14, 15 සහ 17 සිසුන් සඳහා නත්තල් දින වැඩසටහන 2022 දෙසැම්බර් 12 වැනි දින පවත්වන ලදී.

ශිෂ්‍ය ක්‍රීඩා සහ සුභසාධක සංගමය;

- ක්‍රිකට් තරඟාවලිය 2022 මාර්තු 28 දින පවත්වන ලදී.
- ලේ දන්දීමේ ව්‍යාපාරය 2022 මැයි 17 දින පවත්වන ලදී.
- වෙස් සහ කැරම් තරඟාවලිය 2022 ඔක්තෝබර් 17 වන දින පවත්වන ලදී.
- ක්‍රීඩා දිනය 2022 ඔක්තෝබර් 24 දින පවත්වන ලදී.

4. මහනුවර පළාත් පාසල



මධ්‍යම පළාතේ තරුණ තරුණියන්ට සත්කාරක ක්ෂේත්‍රයේ රැකියා ලබා ගැනීමට දිරිගැන්වීම සඳහා මහනුවර පළාත් පාසල 1992 දී ආරම්භ කරන ලදී. ආරම්භයේ දී පාසල මහනුවර ක්වීන්ස් හෝටලයේ කොටසක ආරම්භ කරන ලද අතර පසුව එය කුණ්ඩසාලේ වරාපිටියෙහි පිහිටි වර්තමාන ස්ථානයට ගෙන යන ලදී.

<u>පවතින පහසුකම්</u>

- ✓ දේශන ශාලා 08 (එක් එක් ශාලාවේ උපරිම සිසුන් සංඛ්‍යාව 35)
- ✓ පුහුණු මුළුතැන්ගේ 01 (ස්ථාන 15) සහ 01 පුහුණු ආපනශාලා (ආවරණ 40)
- ✓ මොක් අප් (Mock-up) කාමර 01
- ✓ පරිගණක විද්‍යාගාර 01 (Desktop පරිගණක 30)
- ✓ අමුත්තන්ගේ කාමර 04 (ශිෂ්‍ය ප්‍රායෝගික පුහුණුව සඳහා ආදර්ශ කාමර)
- ✓ ගෘහ පාලන නිරූපණ කාමර 01
- ✓ ශ්‍රවණාගාර 01 (ආසන ධාරිතාව)
- ✓ එළිමහන් රංග පීඨ 01
- ✓ පුස්තකාල 01
- ✓ භෝජන ශාලා 01 (පුද්ගල ධාරිතාව – 150)

අධ්‍යයන කාර්ය මණ්ඩලය

විදුහල්පතිනි : කුමුදුනී වික්‍රමසිංහ මහත්මිය


අංශය	දේශකවරයාගේ නම	තනතුර
වෘත්තීය සූපවේදය	ලක්මාල් පෙරේරා මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	සන්දීප් රත්නසාමී මහතා	සහකාර කථිකාචාර්ය
	ජානක පෙරේරා මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර සහ පාන මෙහෙයුම්	අයි.ඒ.එස්.බී. දිසානායක මහතා	සහකාර කථිකාචාර්ය
	රසික අතුකෝරල මහතා	සහකාර කථිකාචාර්ය
	අමිල අල්විස් මහතා	සහකාර කථිකාචාර්ය
පෝෂණය සහ ආහාර ස්වස්ථිතාව	කේ.ජී.එස්.ඩී. ගුණසිංහ මෙනවිය	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	රියෙන්සි ජයවර්ධන මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
ගෘහ පාලන මෙහෙයුම්	බ්‍රයන් බෙනඩික්ට් මහතා	සහකාර කථිකාචාර්ය

සටහන: *මෙයට අමතරව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන මහනුවර පළාත් පාසලේ බාහිර කථිකාචාර්යවරුන් 22 දෙනෙක් ද සේවය කළහ.*

2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

වගුව 06: 2021 සහ 2022 දී මහනුවර පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	26	26
	අවන්හල් සහ බීමහල් සේවා	04	13
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	-
	හෝටල් ගෘහ පාලනය	-	-
උප එකතුව - ශිල්පීය මට්ටම		**30**	**39**
ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සූපවේදය	25	28
	අවන්හල් සහ බීමහල් සේවා	14	28
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	12	20
	හෝටල් ගෘහ පාලනය	19	22
උප එකතුව - ශිල්පීය මට්ටම		**100**	**98**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	68	68
	ආහාර සහ පාන මෙහෙයුම්	70	61
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	49	43
	හෝටල් ගෘහ පාලනය	56	24
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**243**	**196**
කළමනාකරණ ඩිප්ලෝමාව පාඨමාලාව (තුන් අවුරුදු)		17	39
පේස්ට්‍රි සහ බේකරි වැඩසටහන (පදනම මට්ටම - මාස 3)		-	47
ආධුනිකත්ව වැඩසටහන්		-	41
ආදායම් උත්පාදන වැඩසටහන්		-	59
මුළු එකතුව		**360**	**519**



	ශිල්පීය මට්ටම	ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සහතිකපත්‍ර මට්ටම	කළමනාකරණ ඩිප්ලෝමාව (තුන් අවුරුදු)	පේස්ට්‍රි සහ බේකරි (මාස 3)	ආධුනිකත්ව වැඩසටහන්	ආදායම් උත්පාදන වැඩසටහන්
2021	30	100	243	39	0	0	0
2022	39	98	196	17	47	41	59

මහනුවර පළාත් පාසලේ පුහුණුව ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව 2021 දී 360 සිට 2022 දී 519 දක්වා ඉහළ නංවන ලදී.

2022 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධන සහ අනෙකුත් වැඩසටහන්

- "Ceylon Exhibitors" විසින් පවත්වන ලද EDU EX ප්‍රදර්ශනය සහ පොළ.
- මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාල කාර්ය මණ්ඩලය සඳහා හෝටල් මෙහෙයුම් පිළිබඳ වැඩමුළුව. (ප්‍රායෝගික මූලික පුහුණුව සඳහා සති 08 අවසන් දින)
- මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් ළමුන් 200ක් සඳහා හෝටල් ක්‍රියාකාරිත්වය පිළිබඳව (ප්‍රායෝගික පදනමින්) දැනුවත් කිරීම.

2022 දී පවත්වන ලද ආදායම් උත්පාදන වැඩසටහන්

- සති අන්තයේ පේස්ට්‍රි සහ බේකරි වැඩසටහන - වැඩසටහන් 02ක් සම්පූර්ණ කර ඇත. (ආසන්න වශයෙන් සිසුන් 55)

2022 දී සංවිධානය කරන ලද අනෙකුත් විශේෂ ක්‍රියාකාරකම්

- ලෝක සංචාරක දිනය (2022) සමරන ලදී - ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය විසින් පවත්වනු ලබන පාඨමාලා පිළිබඳ දැනුවත් කිරීමේ සැසියක් සඳහා ප්‍රමුඛ පෙළේ පාසල් 10ක සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ සිසුන්ට ආරාධනා කරන ලදී.
- ප්‍රාදේශීය ලේකම් කාර්ය මණ්ඩල සඳහා සති අන්ත දින 8කදී හෝටල් මෙහෙයුම් පුහුණුව පවත්වන ලදී.

5. කොග්ගල පළාත් පාසල



1992 වසරේ වැලිගම බේ ඉන් හෝටලයේ දී දකුණු පළාත සඳහා වූ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන පාසල ආරම්භ වූ අතර පසුව ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය මඟින් පිරිනමන පාඨමාලා සඳහා පවතින ඉහළ ඉල්ලුමට සරිලන පරිදි සහ සිසුන්ට ප්‍රමාණවත් පහසුකම් සැපයීම පිණිස 2008 වසරේ කොග්ගල ස්ථාපනය කරන ලදී.

<u>පවතින පහසුකම්</u>

- ✓ දේශන ශාලා 06 (උපරිම සිසුන් 30 බැගින්)
- ✓ පුහුණු මුළුතැන්ගෙය 01
- ✓ ගබඩා 01
- ✓ පුහුණු ආපන ශාලා 01
- ✓ මොක්අප් (Mock-up) කාමර 02
- ✓ පරිගණක විද්‍යාගාරය
- ✓ පුස්තකාල 01

<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

විදුහල්පති : ආචාර්ය ආර්.ඩී.ඒ. ලෙනාඩ් මහතා


අංශය	දේශකවරයාගේ නම	තනතුර
වෘත්තීය සූපවේදය	ජී. පේරුසිංහ මහතා	සහකාර කථිකාචාර්ය
	ටී.බී. චාමර මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර සහ පාන මෙහෙයුම්	එම්.ඒ. බුද්ධික මහතා	සහකාර කථිකාචාර්ය
	එල්.එස්. වසන්ත මහතා	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	එච්.කේ.ඩබ්. චන්දන මහතා	සහකාර කථිකාචාර්ය
	එච්.එල්.ඒ. සමන්මලී මිය	සහකාර කථිකාචාර්ය
ගෘහපාලන මෙහෙයුම්	ඉන්දික මොහොට්ටි මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	පී.එස්.ඩබ්. එමානුවෙල් මහතා	සහකාර කථිකාචාර්ය

සටහන: *මෙයට අමතරව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන කොග්ගල පළාත් පාසලේ බාහිර කථිකාචාර්යවරුන් 06 දෙනෙක් ද සේවය කළහ.*

2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

වගුව 07: 2021 සහ 2022 දී කොග්ගල පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	16	24
	අවන්හල් සහ බීමහල් සේවා	05	-
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	02	-
	හෝටල් ගෘහ පාලනය	-	-
උප එකතුව - ශිල්පීය මට්ටම		**23**	**24**
ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සූපවේදය	18	28
	අවන්හල් සහ බීමහල් සේවා	04	32
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	07	25
	හෝටල් ගෘහ පාලනය	01	14
උප එකතුව - ශිල්පීය මට්ටම		**53**	**99**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	58	66
	ආහාර සහ පාන මෙහෙයුම්	58	64
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	48	69
	හෝටල් ගෘහ පාලනය	48	50
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**212**	**249**
සංචාරක රියදුරන්ගේ පුහුණු වැඩසටහන		-	271
මුළු එකතුව		**265**	**643**



කොග්ගල පළාත් පාසලේ ඉහත පාඨමාලා සඳහා පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව 2021 දී 265 සිට 2022 දී 643 දක්වා වර්ධනය විය.

6. රත්නපුර පළාත් පාසල



ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) රත්නපුර පළාත් පාසල සබරගමුව පළාතේ පිහිටි ප්‍රමුඛතම සත්කාරක, සංචාරක සහ සංචරණ පාසල වේ. මෙය 2010 අගෝස්තු 31 වැනි දින අතිගරු ජනාධිපතිතුමා අතින් විවෘත කරන ලදී. අනෙකුත් නගරවලට පහසුවෙන් ප්‍රවේශ විය හැකි ස්ථානයක මෙම පාසල පිහිටා ඇත. ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ රත්නපුර පාසල මගින් හෝටල් මෙහෙයුම් කුසලතා, සංචාරක සහ ආගන්තුක සත්කාර ක්ෂේත්‍රය පිළිබඳ දැනුම සහ වෙනස්වන ගෝලීය සත්කාරක පරිසරයට අනුගත වන නවමු පාඨමාලා කෙරෙහි අවධානය යොමු කරයි.

<u>පවතින පහසුකම්</u>

- ✓ දේශන ශාලා 06
- ✓ පුහුණු ආපනශාලා 01
- ✓ පුහුණු මුළුතැන්ගෙවල් 01
- ✓ මොක්අප් (Mock-up) කාමර 02
- ✓ පරිගණක විද්‍යාගාර 01
- ✓ භෝජනාගාර 01

<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

විදුහල්පති : කනිෂ්ක එන්. ජයතුංග මහතා *(2022 ජනවාරි සිට අගෝස්තු දක්වා)*

කණිෂ්ක ඩී. නුගවෙල මහතා – ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය/භාර කථිකාචාර්ය *(2022 සැප්තැම්බර් සිට)*


අංශය	දේශකවරයාගේ නම	තනතුර
ව්‍යක්තීය සූපවේදය	ප්‍රියංක වික්‍රමසිංහ මහතා	කථිකාචාර්ය
	ඩබ්ලිව්.එම්.ඒ.ආර්. විජේකෝන් මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර සහ පාන මෙහෙයුම්	ටී.එම්.කේ.සී.එස්.ආර්. පීරිස් මහතා	සහකාර කථිකාචාර්ය
	ඒ. අල්විස් මහතා	සහකාර කථිකාචාර්ය

සටහන: *මෙයට අමතරව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන රත්නපුර පළාත් පාසලේ බාහිර කථිකාචාර්යවරුන් 08 දෙනෙක් ද සේවය කළහ.*

2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

වගුව 08: 2021 සහ 2022 දී රත්නපුර පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	-	32
	අවන්හල් සහ බීමහල් සේවා	-	18
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	-
	හෝටල් ගෘහ පාලනය	-	-
උප එකතුව - ශිල්පීය මට්ටම		**-**	**50**
ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සූපවේදය	47	37
	අවන්හල් සහ බීමහල් සේවා	32	33
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	05	-
	හෝටල් ගෘහ පාලනය	10	30
උප එකතුව - ශිල්පීය මට්ටම		**94**	**100**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	52	62
	ආහාර සහ පාන මෙහෙයුම්	64	62
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	43	24
	හෝටල් ගෘහ පාලනය	37	32
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම		**196**	**180**
NVQ සති අන්ත හෝටල් වැඩසටහන		-	35
'Gamma Pizza Hut' පුහුණු වැඩසටහන		-	30
මුළු එකතුව		**290**	**395**



රත්නපුර පළාත් පාසලේ පුහුණුව ලද සිසුන් සංඛ්‍යාව 2021 දී 290 සිට 2022 දී 330 දක්වා වර්ධනය විය.

2022 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධන වැඩසටහන්

- සබරගමුව විශ්වවිද්‍යාලයේ සිසුන් 28 දෙනෙකු සඳහා 2022 ජනවාරි 1, 2, 8 සහ 9 යන දිනවල ප්‍රායෝගික සැසි පවත්වන ලදී.
- බටංගල විශ්වවිද්‍යාල විද්‍යායතන සිසුන් 16 දෙනෙකු සහ සිසුන් 14 දෙනෙකු සඳහා ප්‍රායෝගික සැසි 2022 ජනවාරි 10 සහ 12 යන දිනයන්හිදී පවත්වන ලදී.
- 2022 පෙබරවාරි 2 වැනි දින සිසුන් සඳහා ලිංගාශ්‍රිත රෝග වළක්වා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- පහත සඳහන් ස්ථානවල දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී:
    - 2022 මාර්තු 18 වැනි දින බටුහේන ජාතික පාසලේ සිසුන් 200ක් සඳහා .
    - 2022 මාර්තු 23 දින පැල්මඩුල්ල ජාතික පාසලේ සිසුන් 220ක් සඳහා.
    - කුරුවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සිසුන් සඳහා 2022 මාර්තු 29වැනි දින.
    - රත්නපුර ශාන්ත ලූක්ස් විද්‍යාලයේ සිසුන් සඳහා 2022 අගෝස්තු 23 වැනි දින.
    - සබරගමුව විශ්වවිද්‍යාලයේ සිසුන් 24 දෙනෙකු සහ සිසුන් 23 දෙනෙකු සඳහා පිළිවෙලින් 2022 අගෝස්තු 28 සහ 29 යන දිනවල ප්‍රායෝගික සැසි පවත්වන ලදී.

7. කුරුණෑගල පළාත් පාසල



ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ (SLITHM) කුරුණෑගල පළාත් පාසල 1997 දී කුරුණෑගල නුවර පාරේ Kandyan Reach හෝටලයෙහි සිය මෙහෙයුම් ආරම්භ කරන ලදී. වයඹ පළාත් සභාව යටතේ වයඹ සංවර්ධන අධිකාරියේ (WDA) සහයෝගීතාවයෙන් 2015 වසරේ SLITHM හි කුරුණෑගල පළාත් පාසල නැවත ස්ථාපිත කරන ලදී. මෙම පාසල කුරුණෑගල බෝයගනේ මගුරුඔයවත්තේ පිහිටා ඇත.

<u>පවතින පහසුකම්</u>

- ✓ දේශන ශාලා 04 (එක් එක් ශාලාවේ උපරිම සිසුන් සංඛ්‍යාව 30)
- ✓ පුහුණු මුළුතැන්ගෙය 01
- ✓ පුහුණු ආපනශාලා 01
- ✓ මොක්අප් කාමර (Mock-up Room) 01
- ✓ පරිගණක විද්‍යාගාරය 01
- ✓ ශ්‍රවණාගාර 01
- ✓ ආපනශාලා 01
- ✓ පුස්තකාල 01

<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>

විදුහල්පති : රියන්සි ජයවර්ධන මහතා


අංශය	දේශකවරයාගේ නම	තනතුර
වෘත්තීය සූපවේදය	ජේ.එස්.බී. වීරකෝන් මහතා	ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය
	ඩබ්ලිව්.එම්.පී.ඩබ්ලිව්.එම්.එස්. මඩවල මහතා	සහකාර කථිකාචාර්ය
ආහාර සහ පාන මෙහෙයුම්	එච්.එම්.අයි.බී. සෙනෙවිරත්න මහතා	සහකාර කථිකාචාර්ය
	ඒ.එම්.ජේ.කේ. අත්තනායක	සහකාර කථිකාචාර්ය
ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	ඩබ්ලිව්.එම්.එස්.පී. වීරකෝන් මහතා	සහකාර කථිකාචාර්ය
ගෘහ පාලන මෙහෙයුම්	එම්.බී.ජේ.එම්.අයි.බී. ජයසේකර මහතා	කථිකාචාර්ය

සටහන: *මෙයට අමතරව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන කුරුණෑගල පළාත් පාසලේ බාහිර කථිකාචාර්යවරුන් 09 දෙනෙක් ද සේවය කළහ.*

2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

වගුව 09: 2021 සහ 2022 දී කුරුණෑගල පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	35	33
	අවන්හල් සහ බීමහල් සේවා	27	21
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	06
	හෝටල් ගෘහ පාලනය	-	07
උප එකතුව - ශිල්පීය මට්ටම		**-**	**37**
ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සූපවේදය	-	25
	අවන්හල් සහ බීමහල් සේවා	-	29
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	15
	හෝටල් ගෘහ පාලනය	-	25
උප එකතුව - ශිල්පීය මට්ටම		**-**	**94**
සහතිකපත්‍ර මට්ටම	වෘත්තීය සූපවේදය	64	64
	ආහාර සහ පාන මෙහෙයුම්	57	64
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	50	46
	හෝටල් ගෘහ පාලනය	41	40
උප එකතුව - සහතිකපත්‍ර මට්ටම			**214**
ආධුනිකත්ව වැඩසටහන්		-	31
ආදායම් උත්පාදන වැඩසටහන්		-	43
මුළු එකතුව		**274**	**419**



2021 දී 274 ක් වූ පුහුණු සිසුන් සංඛ්‍යාව 2022 දී 419 දක්වා වර්ධනය විය.

2022 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධන සහ අනෙකුත් වැඩසටහන්

- 2022 ජනවාරි 25 වන දින, ශ්‍රී ලංකන් එයාර්ලයින්හි (Sri Lankan Airlines) ආහාර පාන කළමනාකරු, ගුවන්යානා ඇතුළත සේවා කළමනාකරු, ලංකා හෝටල් පාසල් උපාධිධාරී සංගමයේ (CHSGA) උපාධිධාරී කපිල චන්ද්‍ර මහතා විසින් නව ප්‍රවේශක සහතිකපත් මට්ටමේ සිසුන් සඳහා දේශනයක් පවත්වන ලදී.
- වෘත්තීය සූපවේදය සහ හෝටල් ඉදිරිපස කාර්යාල මෙහෙයුම් සිසුන් සඳහා වෘත්තීය මාර්ගෝපදේශනය සඳහා අමතර සහාය ලබා දෙමින් 2022 පෙබරවාරි 03 සහ 2022 පෙබරවාරි 08 දිනයන්හිදී දෙමාපිය රැස්වීමක් පවත්වන ලදී.
- 2022 පෙබරවාරි 05 වන දින දුරකථන කුසලතා කෙටි පුහුණු පාඨමාලාවක් පවත්වන ලදී.
- CL030 කණ්ඩායමේ අන්තර් පන්ති කැරම් තරඟාවලිය 2022 මාර්තු මාසයේදී පාසල් පරිශ්‍රයේදී පැවැත්විණි.
- කාන්තා දින සැමරුම - 2022 මාර්තු 17 වන දින පැවති 'හිල්ටන් ග්‍රෑජ්' සමඟ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ තරුණ ශිෂ්‍යාවන්ගේ අත්දැකීම් හුවමාරු කර ගැනීමේ "අභියෝග කිරීම තෝරා ගන්න" මැයෙන් මාර්ගගත වැඩසටහනක් පවත්වන ලදී.
- 2022 මාර්තු 30 වන දින "ආගන්තුක සත්කාර කර්මාන්තයේ ආහාර සහ පානවල ප්‍රවණතා" සම්බන්ධයෙන් මහනුවර OZO හෝටලයේ ආහාර සහ පාන කළමනාකරු විසින් ආරාධිත දේශනයක් පවත්වන ලදී.
- 2022 අප්‍රේල් 06 වන දින වයඹ පළාත් පොලිස් අභ්‍යාස ඇකඩමියේ පොලිස් කොස්තාල්, උප පොලිස් පරීක්ෂකවරුන් සඳහා වන රූපලාවන්‍ය, පුද්ගලික සංවර්ධන සහ මේස ආචාර ධර්ම වැඩසටහනක් පවත්වන ලදී.
- 2022 අප්‍රේල් 08 දින පැවති වාරියපොල Labinate අධ්‍යාපන ආයතනයේ සිසුන් 20 දෙනෙකු සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන සහ වගු ආචාර ධර්ම වැඩසටහනක් පවත්වන ලදී.
- ශිෂ්‍ය සුභසාධක සංගමය විසින් සංවිධානය කරන ලද සිංහල දෙමළ අලුත් අවුරුදු සැමරුම සහ උත්සවය - 2021 සඳහා 2022 අප්‍රේල් 09 වන දින CL030 කණ්ඩායමේ සියලුම සිසුන් සහ ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය කුරුණෑගල පළාත් පාසල සියලුම කාර්ය මණ්ඩලය සහභාගීත්වයෙන් සිදු කරන ලදී.
- 2022 අප්‍රේල් 09 වන දින කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් කුරුණෑගල කැන්ඩියන් රීච් හෝටලයේ දී ආර්. ජයවර්ධන (විදුහල්පති) සහ ජේ.එස්.බී. වීරකෝන් (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) යන මහත්වරුන්ගේ සහභාගීත්වයෙන් දිස්ත්‍රික් TVET සංවිධාන කමිටුව පිහිටුවීම සඳහා රැස්වීමක් ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) කුරුණෑගල පළාත් පාසල මඟින් සංවිධානය කරන ලදී.
- 2022 අප්‍රේල් 21 වන දින CL030 කණ්ඩායමේ වෘත්තීය සූපවේදය, අවන්හල් සහ බීමහල් සේවා, ඉදිරිපස කාර්යාල මෙහෙයුම්, හෝටල් ගෘහ පාලනය හදාරන සිසුන් සඳහා ගුවන් හමුදා නිලධාරි ලුතිනන් වරාපිටිය විසින් කණ්ඩායම් ගොඩනැගීමේ වැඩසටහනක් පවත්වන ලදී.
- ආගමික ක්‍රියාකාරකම් යටතේ 2022 අගෝස්තු 24 වන දින ක්‍රීඩා හා සුභසාධක සංගමයේ සහතිකපත් මට්ටමේ 033 ශිෂ්‍ය කණ්ඩායම විසින් සංවිධානය කරන ලද 'පූජ්‍යපාත රණාලේ ඥාණාලෝක නාහිමිපාණන් විසින් ධර්ම වැඩසටහනක් පවත්වන ලදී.
- 2022 සැප්තැම්බර් 08 වන දින ක්‍රීඩා හා සුබසාධන සංගමයේ සහතිකපත් මට්ටමේ 033 ශිෂ්‍ය කණ්ඩායම විසින් 'ප්‍රථමාධාර පුහුණු වැඩසටහනක් සංවිධානය කරන ලදී.
- 2022 සැප්තැම්බර් 14 වන දින ක්‍රීඩා සහ සුබසාධන සංගමයේ සහතිකපත් මට්ටමේ 033 ශිෂ්‍ය කණ්ඩායම විසින් මත්ද්‍රව්‍ය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී.
- 'ලෝක සංචාරක දින සැමරුම' - කුරුණෑගල නගර ප්‍රදේශයේ ආකර්ශනීය ස්ථාන ප්‍රවර්ධනය කිරීම සඳහා සහතිකපත් මට්ටමේ 033 කණ්ඩායම විසින් 2022 ඔක්තෝබර් 27 වන දින පැවති පා පැදි සවාරියක් සංවිධානය කරන ලදී.

2022 දී සංවිධානය කරන ලද අනෙකුත් විශේෂ ක්‍රියාකාරකම්

- වෘත්තීය සංක්‍රමණය වී නැවත පැමිණි සේවකයන් 155 දෙනෙකුගේ සූපවේදය, අවන්හල් සහ බීමහල් සේවා, ඉදිරිපස කාර්යාල මෙහෙයුම්, හෝටල් ගෘහ පාලනය ඇතුළු තුසලතා වැඩි දියුණු කිරීම.

8. මඩකලපුව පළාත් පාසල



2015 වර්ෂයේ දී විසින් සත්කාරක කළමනාකරණය පිළිබඳ මූලික පාඨමාලාවක් පැවැත්වීම සඳහා පාසිකුඩා හී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට අයත් ජාතික නිවාඩු නිකේතන කාර්යාලයේ හෝටල් පාසලක් තාවකාලිකව පිහිටුවීමට තීරණය කළේය. රුපියල් මිලියන 1.2ක වියදමින් ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය කරන ලදී. 2017 වර්ෂය වනවිට, හෝටල් ගෘහ පාලනය සහ ආපනශාලා සහ බීමහල් සේවා සහ ආධුනිකත්ව මට්ටම වැනි වෙනත් ශිල්පීය මට්ටමේ පාඨමාලා පැවැත්වීමේ ප්‍රතිලාභය පාසිකුඩා පළාත් පාසලට හිමි විය. එය නැගෙනහිර පළාත සඳහා ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනය මගින් පිහිටුවන ලද පළාත් පාසල ලෙස ද සලකන ලදී. පසුව මෙම පාසල 2022 මැයි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මඩකලපුවට ගෙන යන ලදී.

අධ්‍යයන කාර්ය මණ්ඩලය


භාර කථිකාචාර්ය: ඒ.එම්. රිසාන් මහතා

සටහන: *ඊට අමතරව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන මඩකලපුව පළාත් පාසලේ තවත් බාහිර කථිකාචාර්යවරයෙක් ද සේවය කරන ලදී.*

2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව

වගුව 10: 2021 සහ 2022 දී මඩකලපුව පළාත් පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	-	-
	අවන්හල් සහ බීමහල් සේවා	-	-
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	-
	හෝටල් ගෘහ පාලනය	-	8
ශිල්පීය මට්ටම (13න් වසර වැඩසටහන)	සූපවේදය	-	-
	අවන්හල් සහ බීමහල් සේවා	-	-
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	-	-
	හෝටල් ගෘහ පාලනය	36	15
උප එකතුව - ශිල්පීය මට්ටම		**36**	**23**
ආධුනිකත්ව වැඩසටහන්		-	13
මුළු එකතුව		**36**	**36**



2021 සහ 2022 යන වර්ෂ දෙකේදීම මුළු සිසුන් සංඛ්‍යාවේ වෙනසක් නොපෙන්වන ලදී.

2022 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධන වැඩසටහන්

- 2022 ඔක්තෝම්බර් 21 වැනි දින මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී නිපුණතා සංවර්ධන නිලධාරියා හරහා ශිල්පීය මට්ටමේ ගෘහ පාලන සිසුන් සඳහා ශිෂ්‍ය උපදේශන වැඩසටහන් පවත්වන ලදී.

2022 දී පවත්වන ලද අනෙකුත් වැඩසටහන්

- ශිලිපීය මට්ටමේ ගෘහ පාලන කණ්ඩායමේ සිසුන් විසින් ලෝක සංචාරක දිනය දා "2022 සැප්තැම්බර් 27" පිරිසිදු කිරීමේ වැඩසටහනක් කල්ලඩි පාලමේ මග දෙපස සංවිධානය කරන ලදී.

9. යාපනය පළාත් පාසල



ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ යාපනය පළාත් පාසල ආරම්භ කරන ලද්දේ 2018 ඔක්තෝම්බර් මාසයේදීය. මෙම පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වන්නේ උතුරු කලාපයේ පුහුණු සංචාරක සහ සත්කාරක ක්ෂේත්‍රයේ මානව සම්පත් හිඟය මැඩලීමයි. මෙම පියවර මඟින් උතුරු ප්‍රදේශයේ තරුණ තරුණියන්ට සත්කාරක ක්ෂේත්‍රයේ ලාභදායී රැකියා ලබා ගැනීමට හැකි වී තිබේ. ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ හෝටල් සහ නිවාඩු නිකේතන ගණනාවක් ස්ථාපිත කර ඇති අතර මෙමඟින් පුහුණු මානව සම්පත් හිඟයට විසඳුම් ලැබෙනු ඇත.

<u>අධ්‍යයන කාර්ය මණ්ඩලය</u>


භාර කථිකාචාර්ය: නිරංජලා ෆ්‍රැන්සිස් මහත්මිය

සටහන: *ඊට අමතරව ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතන යාපනය පළාත් පාසලේ තවත් බාහිර කථිකාචාර්යවරු දෙදෙනෙක් ද සේවය කරන ලදී.*

<u>2021 සහ 2022 දී පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව</u>

වගුව 11: 2021 සහ 2022 දී අනුරාධපුර පාසලේ පුහුණුව ලැබූ සිසුන් සංඛ්‍යාව.

ප්‍රධාන පාඨමාලා	උප පාඨමාලා	2021	2022
ශිල්පීය මට්ටම	සූපවේදය	26	15
	අවන්හල් සහ බීමහල් සේවා	-	-
	ඉදිරිපස කාර්යාල මෙහෙයුම්	5	-
	හෝටල් ගෘහ පාලනය	-	-
උප එකතුව - ශිල්පීය මට්ටම		**31**	**15**
ආධුනිකත්ව පාඨමාලා		40	-
විශේෂ/ දැනුවත් කිරීමේ වැඩසටහන්		55	25
මුළු එකතුව		**126**	**40**



කොවිඩ් - 19 වසංගතය හේතුවෙන් 2021 සහ 2022 අතර යාපනය පළාත් පාසලේ පුහුණුව ලැබූ මුළු සිසුන් සංඛ්‍යාව 126 සිට 40 දක්වා අඩුවීමක් පෙන්නුම් කරයි.

2022 දී පවත්වන ලද වෘත්තීය සංවර්ධන සහ අනෙකුත් වැඩසටහන්

- 2022 ඔක්තෝම්බර් 07 වන දින නවරාත්‍රී පූජා උත්සවය පවත්වන ලදී.
- 2022 සැප්තැම්බර් 27 වන දින ලෝක සංචාරක දිනය සැමරීම සඳහා රුක් රෝපණයක් පවත්වන ලදී.

4.1.3 ප්‍රධාන කාර්යාලයේ අංශවල කාර්යසාධනය

1. ලේඛකාධිකාරී කාර්යාලය

<u>ලේඛකාධිකාරී කාර්යාලයේ ප්‍රධාන කාර්යයන් වනුයේ:</u>

- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයට සිසුන් බඳවා ගැනීම සහ වාර්තා පවත්වාගෙන යාම.
- විභාග පැවැත්වීම, සියලුම මට්ටම්වල ප්‍රතිඵල නිකුත් කිරීම සහ සුදුසුකම්ලත් සිසුන්ට සහතික ප්‍රදානය කිරීම.
- සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- වාර්ෂික උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම.
- බාහිර කථිකාචාර්යවරුන් පත් කිරීම සහ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය සමඟ ඔවුන්ගේ ගිවිසුම් පවත්වාගෙන යෑම.

<u>ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය පහත පාඨමාලා පවත්වාගෙන යනු ලබයි</u>

- **වසර 04 කළමනාකරණ ඩිප්ලෝමාව:**
  සියලුම සහතික මට්ටමේ වැඩසටහන් හතර ඇතුළුව අතරමැදි සහ උසස් මට්ටමේ පාඨමාලා සම්පූර්ණ කිරීමෙන් පසු සිසුන් සිවි අවුරුදු කළමනාකරණ ඩිප්ලෝමාව සඳහා සුදුසුකම් ලබයි. මෙය පවත්වනු ලබන්නේ කොළඹ පාසලේ පමණි.

- **වසර 03 කළමනාකරණ ඩිප්ලෝමාව:**
  අ.පො.ස උසස් පෙළ සුදුසුකම් සහිත සිසුන් සඳහා පිරිනමන විශේෂිත ඩිප්ලෝමා වැඩසටහන කොළඹ සහ මහනුවර පාසල්වල පමණක් පවත්වනු ලැබේ.

- **සහතිකපත් මට්ටම:**
  වසර හතරක කළමනාකරණ ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම සඳහා මූලික ප්‍රවේශ මට්ටමේ සුදුසුකම මෙය වේ. අ.පො.ස. සාමාන්‍ය පෙළ සුදුසුකම් ඇති සිසුන්ට පිරිනමනු ලබන අතර එය කොළඹ සහ සියලුම පළාත් පාසල්වල පවත්වනු ලැබේ.

- **ශිල්පීය මට්ටම:**
  08 ශ්‍රේණියේ සුදුසුකම් ලබා ඇති පාසල් හැර ගිය අය සඳහා ප්‍රවේශ මට්ටමේ මාස තුනක පාඨමාලාවක් වන මෙය කොළඹ සහ සියලුම පළාත් පාසල්වල පවත්වනු ලැබේ.

- **පේස්ට්‍රි සහ බේකරි පිළිබඳ සහතිකපත් පාඨමාලා:**
  මෙම වැඩසටහන 2022 දී හඳුන්වා දෙන ලද අතර කොළඹ දී පවත්වනු ලැබේ.

- **පේස්ට්‍රි සහ බේකරි පිළිබඳ පදනම් පාඨමාලා:**
  මෙම වැඩසටහන 2003 වසරේ හඳුන්වා දුන් අතර කොළඹ, යාපනය සහ මඩකලපුව හැර මහනුවර, කොග්ගල, අනුරාධපුර, බණ්ඩාරවෙල, සහ කුරුණෑගල යන පාසල්වල පවත්වනු ලැබේ.

- **විශේෂ පුහුණු වැඩසටහන්:**
  රජයේ සහ අනෙකුත් ආයතනවල නිශ්චිත ඉල්ලීම් මත විශේෂ පුහුණු වැඩසටහන් පවත්වනු ලැබේ.

- **ආධුනිකත්ව මට්ටම:**
  පූර්ව ප්‍රවේශ මට්ටමේ එක් මාසයක වැඩසටහනකි. මෙම පාඨමාලාව ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතන ප්‍රධාන කාර්යාලයේ සහ පළාත් පාසල් වල පැවැත්වේ. මාසයක පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු සිසුන්ට ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය මගින් පවත්වනු ලබන ශිල්පීය මට්ටමේ පාඨමාලා සඳහා ලියාපදිංචි විය හැක.

✪ **සංචාරක මාර්ගෝපදේශ පුහුණු වැඩසටහන්:**

ජාතික (National), ෂෝෆර් (Chauffer), ප්‍රාදේශීය (Area) සහ ප්‍රදේශ (Site) ලෙස මාර්ගෝපදේශ වර්ග හතරක් ඇත. සියලුම සංචාරක මාර්ගෝපදේශ පාඨමාලා ස්වයං මූල්‍යකරණ පාඨමාලා වේ. සුදුසුකම්ලත් මාර්ගෝපදේශකයින් සඳහා බලපත්‍රය නිකුත් කරනු ලබන්නේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන ආයතනය විසිනි.

<u>ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමය</u>

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට පාඨමාලා හැදෑරීමට පහසුකම් සැලසීම සඳහා ශිෂ්‍යත්ව යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරන ලදී. යම් පවුලකට සමෘද්ධි ප්‍රතිලාභයක් හිමි වන්නේ නම්, සිසුන්ට සම්පූර්ණ ශිෂ්‍යත්වයක් ප්‍රදානය කරන ලද අතර 2022 දී සිසුන් 110 දෙනෙකුට ශිෂ්‍යත්ව ප්‍රදානය කරන ලදී.

2. මානව සම්පත් සහ පරිපාලන අංශය

<u>මානව සම්පත් අංශයේ කාර්යයන් වන්නේ:</u>

- සංචාරක සහ සත්කාරක ක්ෂේත්‍රයට ගැළපෙන පරිදි ආයතනික සංවිධාන ව්‍යුහය ප්‍රතිසංස්කරණය කර ශක්තිමත් කිරීම.
- ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය, සංචාරක හා ආගන්තුක සත්කාර කළමනාකරණය සඳහා විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානයක් බවට පත් කිරීම සඳහා කොළඹ සහ පළාත් පාසල්වල පවතින යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම.
- කළමනාකරණ අවශ්‍යතාවයන්ට අනුව නව පළාත් පාසල් පිහිටුවීම.
- සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන් පැවැත්වීම තුළින් අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ධාරිතා ගොඩනැගීම.

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 222කි. එය සමුද්‍රා පුහුණු හෝටලය ඇතුළුව අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා 132කින්ද අධ්‍යන කාර්ය මණ්ඩලය 90කින්ද සමන්විත වේ. 2022 වසර අවසන් වන විට තත්‍ය සේවක සංඛ්‍යාව 183 ක් වූ අතර එය පහත ආකාරයට පෙන්නුම් කළ හැකියි.

කාණ්ඩය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය
අධ්‍යයන කාර්ය මණ්ඩලය	90	75
අනධ්‍යයන කාර්ය මණ්ඩලය	105	91
සමුද්‍රා පුහුණු හෝටලය	27	21
එකතුව	**222**	**187**

<u>2022 වර්ෂයේදී අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පවත්වනු ලබන දේශීය හා විදේශීය පුහුණු වැඩසටහන්</u>

දේශීය පුහුණු වැඩසටහන්:

✪ අධ්‍යයන සහ අනධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා ඉගෙනුම් කළමනාකරණ පද්ධති පුහුණුව - කාර්ය මණ්ඩල සාමාජිකයින් 59 (අධ්‍යයන 35 සහ අනධ්‍යයන 24) දෙනෙකුගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී.

✪ ආරක්ෂකාරී ආරක්ෂක පියවරයන් පිළිබඳ වැඩමුළුව සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 23 දෙනෙකු (අධ්‍යයන 21 සහ 02 අනධ්‍යයන) සහභාගී වන ලදී.

✪ ගොඩනැගිලි සඳහා සැලසුම් ද්‍රව පෙට්‍රෝලියම් වායු පද්ධතිය පිළිබඳ පුහුණුව සඳහා එක් අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු සහභාගී වන ලදී.

- ධනාත්මක මනෝවිද්‍යාව සහ ආතති කළමනාකරණය පිළිබඳ වැඩමුළුව සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 18 දෙනෙකු (අධ්‍යයන 08 සහ 10 අනධ්‍යයන) සහභාගී වන ලදී.
- "සහතිකවල සත්‍යතාව තහවුරු කරන්නේ කෙසේද" පිළිබඳ නොමිලේ webinar වැඩමුළුව සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 02 දෙනෙකු සහභාගී වන ලදී.
- විද්‍යුත් සංචාරක ඉගෙනුම් පාඨමාලා පුහුණුකරු මාර්ගෝපදේශය පිළිබඳ අවසන් සැකසුම් කටයුතු සඳහා වලංගු කිරීමේ වැඩමුළුව සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 03 දෙනෙකු සහභාගී වන ලදී.
- කළමනාකරණ නිපුණතා සංවර්ධනය පිළිබඳ වැඩමුළුව සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 05 දෙනෙකු (අධ්‍යයන 02 ක් සහ අනධ්‍යයන 03) සහභාගී වන ලදී.
- නිපුණතා විදේශ ගමන් බලපත්‍ර පුහුණු වැඩසටහන කාර්ය මණ්ඩල සාමාජිකයින් 103 දෙනෙකු සඳහා (අධ්‍යයන 13 සහ අනධ්‍යයන 90) සඳහා පවත්වන ලදී.
- සහතිකවල සත්‍යතාව (OL) සත්‍යාපනය කරන්නේ කෙසේද යන වැඩමුළුව සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 02 දෙනෙකු සහභාගී වන ලදී.
- ගබඩා කළමනාකරණය, භාණ්ඩ ලේඛනය හැසිරවීම, වාර්ෂික කොටස් සත්‍යාපනය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු සහභාගී වන ලදී.
- පද්ධති සහ ජාල පරිපාලනය පිළිබඳ පුහුණුව සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 02 දෙනෙකු සහභාගී වන ලදී.
- ඵලදායී අභ්‍යන්තර විගණනය පිළිබඳ වැඩමුළුව සඳහා අනධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු සහභාගී වන ලදී.
- ආයතන සංග්‍රහය සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා රීති සම්බන්ධ වැඩමුළුව සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 12 දෙනෙකු (අධ්‍යයන 06 සහ අනධ්‍යයන 06) සහභාගී වන ලදී.
- ඵලදායී සන්නිවේදනය/ පිරිස් ආකල්පය එදිරිව හැසිරීම/රැකියා නියුක්තිය (අභ්‍යන්තර) යන වැඩමුළුව සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 25 දෙනෙකු (අධ්‍යයන 14ක් සහ අනධ්‍යයන 11ක්) සහභාගී වන ලදී.
- ව්‍යක්තීය ප්‍රථමාධාර පුහුණු වැඩසටහන පිළිබඳ පුහුණුව (01 වන මට්ටම) සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 31 දෙනෙකු (අධ්‍යයන 03 සහ අනධ්‍යයන 28) වෙනුවෙන් පවත්වන ලදී.
- කොවිඩ් දැනුවත් කිරීම සහිත ප්‍රාථමික ප්‍රථමාධාර පුහුණුව (01 වන මට්ටම) සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 27 දෙනෙකු (06 අධ්‍යයන සහ 27 අනධ්‍යයන) වෙනුවෙන් පවත්වන ලදී.
- සීගිරියේ පැවති වැඩමුළුව සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයකු සහභාගී වන ලදී.
- ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ පුහුණුව (අභ්‍යන්තර) සඳහා කාර්ය මණ්ඩල සාමාජිකයින් 33 දෙනෙකු (අධ්‍යයන 09 සහ අනධ්‍යයන 24) සහභාගී වන ලදී.
- ගෘහ පාලනය හැඳින්වීම (අභ්‍යන්තර) පිළිබඳ වැඩසටහන සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයින් 03 දෙනෙකු සහභාගී වන ලදී.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් 36 දෙනෙකු සඳහා ගොනු කළමනාකරණය පිළිබඳ පුහුණු (අධ්‍යයන 06 සහ අනධ්‍යයන 30) වැඩමුළුවක් පවත්වන ලදී.
- කාර්ය මණ්ඩල සාමාජිකයින් 15 දෙනෙකු සඳහා (අධ්‍යයන 08 සහ අනධ්‍යයන 07) සඳහා "KPI යනු කුමක්ද" පිළිබඳ වැඩමුළුවක් පවත්වන ලදී.
- සංචාරක ව්‍යාපාර සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (TOT) වැඩසටහනක් පවත්වන ලදී.

විදේශ පුහුණු වැඩසටහන්:

- 2022 ජූලි 01 සිට 2022 ජූලි 21 දක්වා යන දිනයන්හිදී චීනයේ පවත්වන ලද සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා මූල්‍ය හා ආර්ථික කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා (මාර්ගගතව) කාර්ය මණ්ඩල සාමාජිකයින් 04 (අනධ්‍යයන 03 සහ අධ්‍යයන 01) සහභාගී වන ලදී.
- 2022 ජූලි 05 සිට 2022 ජූලි 25 දක්වා චීනයේ පැවති " Belt and Road " රටවල් සඳහා පාරිසරික පාලනය සහ පාරිසරික සංචාරක සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු (මාර්ගගතව) සහභාගී වන ලදී.
- 2022 ජූලි 08 සිට 2022 ජූලි 28 දක්වා චීනයේ පැවති " Belt and Road " රටවල් සඳහා සිවිල් සේවකයන්ගේ රාජ්‍ය සේවා ධාරිතාව ඉහළ නැංවීම පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු (මාර්ගගතව) සහභාගී වන ලදී.
- 2022 ජූලි 08 සිට 2022 ජූලි 28 දක්වා චීනයේ පැවති සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සේවා බාහිරින් ලබා ගැනීමේ සංවර්ධනය සහ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය සඳහා 2022 ජූලි 08 සිට ජූලි 28 දක්වා අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙකු සහභාගී වන ලදී.

3. මූල්‍ය අංශය

මූල්‍ය අංශයේ ප්‍රධාන කාර්යය වන්නේ ආයතනයේ මූල්‍ය කටයුතු ලාභදායී හා කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සහ ආයතනයේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් තීරණ ගැනීම සඳහා කළමනාකරණ මණ්ඩලයට අවශ්‍ය සංඛ්‍යාලේඛන සහ තොරතුරු සැපයීමයි.

සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය සඳහා ප්‍රධාන අරමුදල් මූලාශ්‍ර වන්නේ සංචාරක සංවර්ධන බද්ද සහ ගුවන්තොටුපල බද්ද (Embarkation Levy) යි. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය සංචාරක සංවර්ධන අරමුදල එකතු කර එයින් 12%ක් අප ආයතනය වෙත ලබා දෙනු ලැබේ.

වගුව 12: 2021 සහ 2022 දී ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය වෙත අරමුදල් ලැබූ මූලාශ්‍ර පහත වගුව මගින් පෙන්නුම් කර ඇත.

කාණ්ඩය	2021 (රු.මිලියන)	2020 (රු.මිලියන)
සංචාරක සංවර්ධන අරමුදල (Tourism Development Levy)	145.10	88.20
ගුවන්තොටුපල බද්ද (Embarkation Levy)	311.74	58.07
පාසල් ගාස්තු සහ අනෙකුත් ආදායම්	109.99	79.88
වෙනත් ආදායම්	65.30	37.89
සමුද්‍රා පුහුණු හෝටලය	(9.45)	(15.15)
එකතුව	**622.69**	**248.89**

4. අලෙවිකරණ සහ මහජන සම්බන්ධතා අංශය

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ අලෙවිකරණ අංශය ස්ථාපිත කරන ලද්දේ සිසුන්ගේ නිමැවුම සහ සන්නාම පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ය. ආගන්තුක සත්කාර අංශයේ අධ්‍යාපනයේ තරඟකාරිත්වය වැඩි වෙමින් පවතින අතර පාරිසරික අස්ථාවර ස්වභාවයන් නිසා අනාගත වෙළඳපල අභියෝගවලට මුහුණ දීම සඳහා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයට තවත් අලෙවිකරණ උපාය මාර්ග සහ උපක්‍රම අවශ්‍ය වේ. අලෙවිකරණ අංශය හරහා පහත අරමුණු ඉටුකර ගැනීම බලාපොරොත්තු වේ.

<u>අරමුණු</u>

- පාරිභෝගික තෘප්තිය සහ ගුණාත්මකභාවය විධිමත් කිරීම සඳහා අලෙවිකරණ අරමුණු සහ පාරිභෝගික කේන්ද්‍රීය ප්‍රතිපත්ති සැකසීම.
- ඇල්මැති පාර්ශවකරුවන් අතර සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ ප්‍රතිරූපය වර්ධනය කිරීම සඳහා සියලු සන්නිවේදන මාර්ගයන් වැඩි දියුණු කිරීම.
- විධිමත් සේවා සපයන්නෙකු ලෙස පාරිභෝගික මනසෙහි ස්ථානගත කිරීම සඳහා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ සන්නාම අගයන් පුනර්ජීවනය කිරීම.
- සංවිධානයේ ගුණාත්මක භාවය සහ ප්‍රමිතීන් වර්ධනය කිරීම සඳහා විවිධ සහයෝගය ලබා ගැනීම පිණිස විවිධ කණ්ඩායම් සමඟ හවුල් වීම සහ ජාලගත වීම.

2022 දී සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම්

වෙළඳ නාම අලෙවිකරණය

- වීඩියෝකරණය - වීඩියෝ 9ක් නිර්මාණය කර ඇත.
- ඡායාරූපකරණය - විවිධ වැඩසටහන් සහ උත්සව 17ක් ආවරණය කර ඇත.
- රූපවාහිනී දැන්වීම් - ස්වාධීන රූපවාහිනිය සමඟ එක් වැඩසටහනක් සහ එක් ගුවන්විදුලි වැඩසටහනක් සිදු කිරීම.
- කෙටි පණිවිඩ සේවා අලෙවිකරණය - කෙටි පණිවිඩ සේවා අලෙවිකරණය සඳහා අවශ්‍ය දත්ත ඒකරාශී කර ගැනීම.
- සම්මන්ත්‍රණ පැවැත්වීම - සම්මන්ත්‍රණ 3ක් පවත්වන ලදී.
- වෙබ් අඩවිය සංවර්ධනය කිරීමේ කටයුතු අවසන් කිරීම.

ප්‍රකාශන

- පුවත්පත් දැන්වීම් - පුවත්පත් දැන්වීම් 9ක් පළ කරන ලදී.
- පුවත්පත් ලිපි - ලිපි 5ක් සම්පූර්ණ කරන ලදී.
- “SLITHM Talk” සඟරාව පළ කිරීම - 1, 2, 3 සහ 4 වැනි කාර්තු සඳහා “SLITHM Talk” සඟරා ප්‍රකාශයට පත් කරන ලදී.

5. තොරතුරු තාක්ෂණ (IT) අංශය

අරමුණු

- තොරතුරු තාක්ෂණ සහ පරිගණක පද්ධති කළමනාකරණය කිරීම.
- පද්ධති, ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සැලසුම් කිරීම, සංවර්ධනය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- දත්ත, ජාල ප්‍රවේශය සහ උපස්ථ (Backup) පද්ධතිවල ආරක්ෂාව සහතික කිරීම.
- දෙපාර්තමේන්තු අවශ්‍යතා (අධ්‍යයන/ අනධ්‍යයන) විශ්ලේෂණය කිරීම, දුර්වලතා හඳුනා ගැනීම සහ ඉලක්ක සපුරා ගැනීමේදී කාර්යක්ෂමතාව සහ නිරවද්‍යතාවය ඉහළ නැංවීම.
- මෘදුකාංග සහ දෘඩාංග යන දෙඅංශයෙන්ම සේවකයින් පුහුණු කිරීම, දෝෂ නිරාකරණය සහ අවශ්‍යතාවන් ඇති වූ විට තාක්ෂණික සහාය ලබා දීම.
- ජාලගත සබඳතා, අප ආයතන අවශ්‍යතා සපුරාලන බවට සහ බාධාවකින් තොරව ඒවා ක්‍රියාත්මක වන බවට සහතික වීම, පුළුල් පරාසයක හැකියාවන් භාවිතා කිරීම මෙන්ම නව විශේෂාංග සහ තරහකාරී විසඳුම් පිළිබඳව යාවත්කාලීනව සිටීම.

2022 දී සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම්

- කළමණාකරණ පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.
- ශිෂ්‍ය ගාස්තු අයකිරීමට අවශ්‍ය වන විද්‍යුත් ගෙවීම් පහසුකම ශිෂ්‍ය කළමනාකරණ පද්ධතියට හඳුන්වා දී ආරම්භ කිරීම.

6. පුස්තකාලය



සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ පුස්තකාලය සංචාරක සහ සත්කාරක අංශයේ නියැලී සිටින සිසුන් සහ සංචාරක වෘත්තිකයන් සඳහා ප්‍රධාන තොරතුරු මූලාශ්‍රය වේ. පාඨමාලා සඳහා සහභාගිවන්නන්ගේ මෙන්ම සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ වෘත්තීය කාර්ය මණ්ඩලයේ සහ සංචාරක අංශයේ තොරතුරු සහ අධ්‍යාපනික අවශ්‍යතා සපුරාලීම සඳහා එය ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අංගසම්පූර්ණ පුස්තකාලය පොත් 10,000කට අධික ප්‍රමාණයකින්, සංචාරක වාර්තා 1000කට අධික ප්‍රමාණයකින් සහ තෝරාගත් සඟරාවලින් සමන්විතය. පුස්තකාලයේ විශේෂ පොත්පත් එකතුව අතර ලෝක සංචාරක සංවිධානයේ (WTO) ප්‍රකාශනය, පුහුණු අත්පොත්, ආයතනයේ වාර්ෂික වාර්තා, වාර සඟරා සහ සංචාරක සංඛ්‍යාලේඛන ඇතුළත් වේ. සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ පුස්තකාලය 2020 දී සම්පූර්ණයෙන්ම ප්‍රතිසංස්කරණය කරන ලදී. තවද, සිසුන්ට සහ කාර්ය මණ්ඩලයට ප්‍රමිතිගත සේවාවක් සැපයීම සඳහා පුස්තකාල ස්වයංක්‍රීයකරණ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. ඊට අමතරව පුස්තකාලයේ විද්‍යුත් සම්පත් මධ්‍යස්ථානයක් (Virtual Resource Centre) පිහිටුවීමේ ක්‍රියාවලිය ආරම්භ කළ අතර කොළඹ සහ මහනුවර පුස්තකාල සඳහා පොත් 100කට අධික ප්‍රමාණයක් මිලදී ගෙන ඇත.

සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ පුස්තකාලය එහි සියලුම ක්‍රියාකාරකම් සැකසීම සඳහා ප්‍රතිපත්ති සකස් කර ඇත. පුස්තකාලයේ වර්තමාන අවශ්‍යතා අනුව ප්‍රතිපත්ති සම්පාදනය කර ඇති අතර ඒවා වෙනස් වන පුස්තකාල අවශ්‍යතා අනුව වෙනස් වීමට යටත් වන අතර සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ පුස්තකාලය භාවිතා කරන්නන්ගේ ප්‍රයෝජනය සඳහා සම්පාදනය කර ඇත. ඒ අනුව, සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයේ ඉගැන්වීමේ අවශ්‍යතා සහ ඉගෙනීමේ පර්යේෂණ අවශ්‍යතා සහ ජාතික සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කරන ලද සම්පත් එකතුවක් සංවර්ධනය කිරීමට එකතු කිරීමේ සංවර්ධන ප්‍රතිපත්තිය උපකාරී වේ. තවද, පුස්තකාලය විසින් “SLITHM Talk” කාර්තුමය විද්‍යුත් සඟරාවක් සාර්ථකව ප්‍රකාශයට පත් කරන ලදී.

7. අභ්‍යන්තර විගණන අංශය

2022 වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්මට අනුව, වැඩිදියුණු කිරීම් සඳහා යම් යම් යෝජනා සහ නිර්දේශ සහිතව අභ්‍යන්තර විගණන වාර්තා 05ක් නිකුත් කරන ලදී. අදාළ නිලධාරීන් විසින් ගන්නා ලද ක්‍රියාමාර්ගවල ප්‍රතිඵලයක් ලෙස පිරිවැය අවම කර ගැනීමටත් වඩා හොඳ අභ්‍යන්තර පරීක්ෂාවන් තුළින් ක්‍රියාවලි විධිමත් කිරීමටත් හැකි විය.

<u>විගණන හා කළමනාකරණ කමිටුව (AMC)</u>

යහපාලනය සඳහා වන රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයට අනුව, රාජ්‍ය ව්‍යවසායයේ මෙහෙයුම් සහ කාර්ය සාධනයේ මූල්‍ය අංශ පිළිබඳව නිසි කළමනාකරණ සහ පාලනය අධීක්ෂණය කිරීමට විගණන හා කළමනාකරණ කමිටුවට බලය ඇත.

2022 වර්ෂය තුළ පැවති විගණන කළමනාකරණ කමිටු (AMC) රැස්වීම් පහත පරිදි වේ.

අංකය	දිනය
38වන	2022 අප්‍රේල් 01
39වන	2022 සැප්තැම්බර් 01
40වන	2022 නොවැම්බර් 10
41වන	2022 දෙසැම්බර් 29

8. සමුද්‍රා පුහුණු හෝටලය

සමුද්‍රා පුහුණු හෝටලය, ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය පිහිටි පරිශ්‍රයේම පිහිටා ඇති අතර සමුද්‍රා පුහුණු හෝටලය සහ ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය යන ආයතන දෙකම එකම කළමනාකාරීත්වයක් යටතේ මෙහෙයවනු ලබයි. එය සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයෙහි අධ්‍යාපනය හදාරන සිසුන් ප්‍රායෝගික පුහුණුවේ යෙදවීම යන මූලික අරමුණ සඳහා යොදා ගැනේ.

<u>සමුද්‍රා පුහුණු හෝටලය පහත අංගවලින් සමන්විත වේ:</u>

- ✓ සාධාරණ මිල ගණන් යටතේ ඉහළම මට්ටමේ සුවපහසු කාමර දහයකින් (10) සමන්විත වේ.
- ✓ සමුද්‍රා අවන්හල මඟින් ඕනෑම අවස්ථාවක දී අමුත්තන් 40 සිට 100 දක්වා ආහාර ලබා දිය හැකි අතර අවන්හලට යාබදව කොක්ටේල් විවේකාගාරයක් සහ කුඩ් බීම හළක් ඇත.
- ✓ සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනයෙහි ශ්‍රවණාගාරය රැස්වීම් සම්මන්ත්‍රණ පැවැත්වීම සඳහා සියලු පහසුකම් සහිතව 250ක ආසන ධාරිතාවකින් සමන්විත වේ.
- ✓ ශරීර සුවතා මධ්‍යස්ථානය
- ✓ ලොන්ඩ්‍රිය

9. ලොන්ඩ්‍රිය



වර්තමානයේ ලොන්ඩ්‍රි සහ ඩ්‍රයි ක්ලීනිං (Laundry & Dry Cleaning) ක්‍රියාවලිය ලෝකයේ මහා පරිමාණ කර්මාන්තයක් ලෙස ඉස්මතු ව තිබේ. හෝටල් හා රෝහල් මෙහෙයුම් ඵලදායී ක්‍රියාකාරීත්වයේ මෙම අංශය ඉතා වැදගත් කොටසකි. වෘත්තිය ඩ්‍රයි ක්ලීනිං සහ පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සියලු උපකරණ සමඟ ලොන්ඩ්‍රි සහ ඩ්‍රයි ක්ලීනිං මෙහෙයුම් 2013 ජනවාරි මාසයේ දී ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය විසින් කොළඹ දී අරඹන ලදී. එය ගාලු පාරට මුහුණ ලා බිම් මහළේ පහසු ස්ථානයක පිහිටුවා ඇත. ලොන්ඩ්‍රි සහ ඩ්‍රයි ක්ලීනිං පාඨමාලාවේ න්‍යායාත්මක සහ ප්‍රායෝගික යන දෙඅංශයම සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතන සිසුන් සඳහා පවත්වනු ලැබේ.

5. මූල්‍ය ප්‍රකාශන

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට

මුදල රු. වලින්

	සටහන	2022	2021 (ප්‍රතිස්ථාපිත)
වත්කම්			
ජංගම වත්කම්			
තොග	03	3,781,352	3,847,652
වෙළඳ ණය ගැතියන්	04	24,467,350	22,756,021
(-) අඩමාණ ණය සඳහා ප්‍රතිපාදන		(2,060,033)	(2,207,861)
තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු දේ	05	62,323,237	25,967,777
ශ්‍රී.ල.සං.සං.අ. (SLTDA) වෙතින් ලැබිය යුතු දෑ	06	130,953,875	66,775,024
ණය සහ වෙනත්	07	14,803,982	12,371,773
අත්තිකාරම්	08	333,898	170,000
පෙර ගෙවීම්	09	3,055,943	1,326,315
කෙටි කාලීන ආයෝජන	12	312,295,890	-
මුදල් සහ මුදල් සමාන දෑ	10	211,738,442	168,804,128
මුළු ජංගම වත්කම්		**761,693,936**	**299,810,829**
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත සහ උපකරණ	02	436,268,256	493,471,894
විකතු කළා : නොනිමි වැඩ	11	17,883,586	17,270,187
අස්පෘශ්‍ය වත්කම්			
පරිගණක මෘදුකාංග	02	865,869	841,574
ආයෝජන		-	301,720,753
මුළු ජංගම නොවන වත්කම්		**455,017,712**	**813,304,408**
මුළු වත්කම්		**1,216,711,648**	**1,113,115,238**
වගකීම්			
ජංගම වගකීම්			
බැංකු ශේෂය	10	8,821,536	10,329,730
තැන්පතු / වෙනත් ගෙවිය යුතු දෑ	13	14,550,092	17,056,693
උපචිත වියදම්		35,013,397	41,159,933
මුළු ජංගම වගකීම්		**58,385,026**	**68,546,356**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන	14	39,770,921	37,101,520
ශුද්ධ වත්කම්		**1,118,555,701**	**1,007,467,362**
ශුද්ධ වත්කම් / හිමිකම්			
ප්‍රාග්ධන දායකත්වය		457,350,952	457,350,952
සමුච්චිත අතිරික්තය		583,928,513	471,911,620
JABIC සහ UNDP ප්‍රදාන		1,238,066	2,166,620
ප්‍රත්‍යාගණන සංචිත		76,038,170	76,038,170
මුළු ශුද්ධ වත්කම් / හිමිකම්		**1,118,555,701**	**1,007,467,362**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා කළමනාකරණ මණ්ඩලය වගකිව යුතුය. හිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි. කළමනාකරණ මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් අනුමත කර අත්සන් කරන ලදි.

ශිරන්ත පීරිස්	ජීවන්ති සේනානායක (මිය)	රොයිස් ප්‍රනාන්දු	**මණ්ඩල සාමාජික**
සභාපති	**අධ්‍යක්ෂ ජනරාල්**	**අධ්‍යක්ෂ මූල්‍ය**	SLITHM

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	සටහන	2022	2021 (ප්‍රතිස්ථාපිත)
ආදායම			
සංචාරක සංවර්ධන බද්ද (TDL)	15	145,102,021	88,207,034
අපගමන බද්ද (EL)		311,743,267	58,077,386
පාසල් ගාස්තු සහ වෙනත්	16	109,993,876	80,807,636
වෙනත් ආදායම්	17	65,307,672	38,026,405
හෝටල් සහ ලොන්ඩ්‍රි අතිරික්තය/හිඟය *(52 සහ 53 පිටු බලන්න)*		(9,454,635)	(14,320,404)
මුළු ආදායම		**622,692,201**	**250,798,057**
වියදම්			
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	18	249,884,628	228,936,480
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	19	193,726,882	129,415,133
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	20	63,104,113	66,101,690
වෙනත් වියදම්	21	3,806,963	2,609,625
මූල්‍ය පිරිවැය	22	152,723	158,084
මුළු වියදම්		**510,675,308**	**427,221,012**
අතිරික්තය / (හිඟය)		**112,016,893**	**(176,422,955)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - අනුරාධපුර

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	9,958,950	4,288,500
වෙනත් ආදායම්	99,158	61,714
මුළු ආදායම	**10,058,108**	**4,350,214**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	13,382,279	11,748,614
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	9,595,050	6,397,087
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	2,930,689	3,087,645
වෙනත් වියදම්	330,860	-
මූල්‍ය පිරිවැය	3,750	3,750
මුළු වියදම්	**26,242,628**	**21,237,096**
අතිරික්තය / (හිඟය)	**(16,184,521)**	**(16,886,882)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - බණ්ඩාරවෙල

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	7,907,250	4,432,000
වෙනත් ආදායම්	396,554	19,275
මුළු ආදායම	**8,303,804**	**4,451,275**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	14,541,512	11,772,185
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	11,577,487	8,094,337
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	1,904,037	2,161,150
වෙනත් වියදම්	526,100	46,975
මූල්‍ය පිරිවැය	-	3,750
මුළු වියදම්	**28,549,136**	**22,078,397**
අතිරික්තය / (හිඟය)	**(20,245,332)**	**(17,627,122)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - කොළඹ

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	46,716,386	45,784,925
වෙනත් ආදායම්	64,413,815	34,463,439
මුළු ආදායම	**111,130,201**	**80,248,364**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	137,860,959	127,076,524
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	105,997,363	69,450,027
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	47,566,701	49,353,514
වෙනත් වියදම්	1,345,500	210,950
මූල්‍ය පිරිවැය	143,273	124,134
මුළු වියදම්	**292,913,796**	**246,215,149**
අතිරික්තය / (හිඟය)	**(181,783,595)**	**(165,966,785)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - මහනුවර

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	13,699,600	9,464,810
වෙනත් ආදායම්	89,220	33,818
මුළු ආදායම	**13,788,820**	**9,498,628**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	26,707,480	21,176,427
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	17,591,502	14,915,547
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	919,403	1,156,791
වෙනත් වියදම්	155,003	150,000
මූල්‍ය පිරිවැය	3,750	4,200
මුළු වියදම්	**45,377,138**	**37,402,965**
අතිරික්තය / (හිඟය)	**(31,588,318)**	**(27,904,337)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - කොග්ගල

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	11,586,790	5,536,000
වෙනත් ආදායම්	114,074	89,433
මුළු ආදායම	**11,700,864**	**5,625,433**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	21,478,872	19,287,950
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	20,478,629	13,566,349
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	3,953,679	4,138,393
වෙනත් වියදම්	388,500	-
මූල්‍ය පිරිවැය	-	7,500
මුළු වියදම්	**46,299,680**	**37,000,192**
අතිරික්තය / (හිඟය)	**(34,598,816)**	**(31,374,759)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - රත්නපුර

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	9,667,950	5,198,500
වෙනත් ආදායම්	157,009	44,211
මුළු ආදායම	**9,824,959**	**5,242,711**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	16,053,642	13,750,297
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	13,913,891	8,909,377
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	4,073,085	4,253,260
වෙනත් වියදම්	562,500	-
මූල්‍ය පිරිවැය	450	3,750
මුළු වියදම්	**34,603,568**	**26,916,684**
අතිරික්තය / (හිඟය)	**(24,778,608)**	**(21,673,973)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - කුරුණෑගල

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	9,448,200	4,764,400
වෙනත් ආදායම්	37,827	39,933
මුළු ආදායම	**9,486,027**	**4,804,333**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	16,718,187	13,773,648
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	11,228,859	8,130,656
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	1,170,334	1,194,404
වෙනත් වියදම්	476,000	-
මූල්‍ය පිරිවැය	-	4,000
මුළු වියදම්	**29,593,380**	**23,102,708**
අතිරික්තය / (හිඟය)	**(20,107,353)**	**(18,298,375)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - මඩකලපුව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	388,250	130,000
වෙනත් ආදායම්	-	-
මුළු ආදායම	**388,250**	**130,000**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	1,416,550	2,239,658
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	1,716,126	507,824
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	286,599	311,309
වෙනත් වියදම්	-	-
මූල්‍ය පිරිවැය	-	-
මුළු වියදම්	**3,419,275**	**3,058,791**
අතිරික්තය / (හිඟය)	**(3,031,025)**	**(2,928,791)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - යාපනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
පාසල් ගාස්තු සහ වෙනත්	620,500	286,000
වෙනත් ආදායම්	15	-
මුළු ආදායම	**620,515**	**286,000**
වියදම්		
වැටුප් සහ සේවක ප්‍රතිලාභ	1,725,147	1,288,603
වේතන, පරිපාලන සහ ආයතනික වියදම්	1,627,975	1,949,301
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	299,585	295,476
වෙනත් වියදම්	22,500	-
මූල්‍ය පිරිවැය	1,500	7,000
මුළු වියදම්	**3,676,707**	**3,540,380**
අතිරික්තය / (හිඟය)	**(3,056,192)**	**(3,254,380)**

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - සමුද්‍රා පුහුණු හෝටලය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
අවන්හල් ආදායම	9,898,611	2,240,017
කාමරවලින් ලද ආදායම	1,385,105	601,250
වෙනත් ආදායම්	5,390,931	1,209,886
මුළු ආදායම	**16,674,646**	**4,051,153**
වියදම්		
විකුණුම් පිරිවැය	7,861,925	1,148,914
වැටුප් සහ දීමනා	12,839,139	11,804,989
නිවාඩු දින වැඩ කිරීමේ දීමනා	-	3,702
අතිකාල දීමනා	327,952	64,677
කාර්ය මණ්ඩල දිරි දීමනා	1,344,601	500,000
සේවක අර්ථසාධක අරමුදල	1,532,036	1,579,037
සේවක භාරකාර අරමුදල	306,407	315,807
කාර්ය මණ්ඩල ශුභසාධනය	-	305,370
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	358,093	111,935
නඩත්තුව	42,700	2,790
කාර්යාලීය සංග්‍රහ	931,366	318,976
බොල් ණය සඳහා ප්‍රතිපාදන	1,390,344	2,207,860
වෙනත් වියදම්	1,159,661	7,500
මුළු වියදම්	**28,094,224**	**18,371,557**
අතිරික්තය / (හිඟය)	**(11,419,578)**	**(14,320,404)**

සටහන: *සමුද්‍ර පුහුණු හෝටලයේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සකස් කිරීමේදී විශේෂයෙන් හඳුනාගත හැකි වියදම් පමණක් සලකා බලන ලදී. වක්‍ර වියදම් හඳුනාගෙන ඒවා මූල්‍ය ප්‍රකාශන තුල වෙන් කිරීම සඳහා ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කිරීමට 2023.01.01 දින සිට කටයුතු කරනු ලැබේ.*

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - සමුද්‍රා ලොන්ඩ්‍රිය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල රු. වලින්

	2022	2021
ආදායම		
ලොන්ඩ්‍රි ආදායම	6,217,468	968,222
වෙනත් ආදායම්	-	-
මුළු ආදායම	**6,217,468**	**968,222**
වියදම්		
විකුණුම් පිරිවැය	588,117	188,100
වැටුප් සහ දීමනා	2,142,900	3,062,354
නිවාඩු දින වැඩ කිරීමේ දීමනා	-	-
අතිකාල දීමනා	35,534	2,998
කාර්ය මණ්ඩල දිරි දීමනා	215,561	150,000
සේවක අර්ථසාධක අරමුදල	250,335	357,825
සේවක භාරකාර අරමුදල	50,067	74,565
කාර්ය මණ්ඩල ශුභසාධනය	-	-
කාර්ය මණ්ඩල නිල ඇඳුම්	58,489	46,672
නඩත්තුව	910,024	153,780
කාර්යාලීය සංග්‍රහ	-	-
බොල්ණය සඳහා ප්‍රතිපාදන	-	-
වෙනත් වියදම්	1,500	7,500
මුළු වියදම්	**4,252,526**	**4,043,794**
අතිරික්තය / (හිඟය)	**1,964,942**	**(3,075,572)**

සටහන: *2022 වසරේ සිට SLITHM හි සමුද්‍ර ලොන්ඩරි සඳහා වෙනම මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට අපි කටයුතු කර ඇත. එබැවින් 2021 සඳහා ඇතුළත් කර ඇති සංසන්දනාත්මක සංඛ්‍යා සඳහා උචිත තොරතුරු පමණක් ඉදිරිපත් කරන ලදී. අතිරේකව, සමුද්‍ර ලොන්ඩරියේ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය සකස් කිරීමේදී 2022 සඳහා විශේෂයෙන් හඳුනාගත හැකි වියදම් සලකා බලන ලදී. වක්‍ර වියදම් හඳුනාගෙන ඒවා මූල්‍ය ප්‍රකාශන තුල වෙන් කිරීම සඳහා ප්‍රතිපත්ති ලේඛනයක් සකස් කිරීමට 2023.01.01 දින සිට කටයුතු කරනු ලැබේ.*

මූල්‍ය ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට

මුදල රු. වලින්

	2022	2021 (ප්‍රතිස්ථාපිත)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
ශුද්ධ අතිරික්තය / (හිඟය)	112,016,893	(176,422,955)
මුදල් නොවන වෙනස්වීම		
ක්ෂය වීම	64,014,136	66,101,690
පාඩු / කපා හැරීම් සඳහා වෙන්කිරීම්	1,366,347	112,802
අපහරණය මත ලාභය	-	(166,939)
බොල් ණය සඳහා වෙන්කිරීම්	(147,827)	2,207,861
JABIC සහ UNDP ප්‍රදාන ක්‍රමක්ෂය	(928,553)	(928,553)
අමාත්‍යාංශය වෙතින් ලැබුණු පරිත්‍යාග ක්‍රමක්ෂය	(48,150)	(23,265)
ආයෝජන මත පොලී ආදායම	(59,155,672)	(32,487,088)
කුලී ආදායම	(2,590,729)	(2,040,000)
පාරිතෝෂික සඳහා වෙන්කිරීම්	6,170,197	5,708,216
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය	120,696,642	(137,938,232)
කාරක ප්‍රාග්ධනයේ වෙනස්කම්		
බඩු තොගයේ (වැඩි වීම)/(අඩු වීම)	66,300	1,507,834
වෙළඳ ණය ගැතියන් (වැඩි වීම)/(අඩු වීම)	(3,077,676)	(390,854)
තැන්පතු සහ අනෙකුත් ලැබිය යුතු දෑ (වැඩි වීම)/(අඩු වීම)	(6,333,860)	2,139,607
SLTDA වෙතින් ලැබිය යුතු මුදල් (වැඩි වීම)/(අඩු වීම)	(64,178,851)	(26,784,205)
පෙර ගෙවීම් (වැඩි වීම)/(අඩු වීම)	(1,729,628)	1,588,940
ණය සහ අත්තිකාරම් (වැඩි වීම)/(අඩු වීම)	(2,596,107)	2,552,245
ගෙවිය යුතු තැන්පතු වල (වැඩි වීම)/(අඩු වීම)	(2,458,450)	4,118,933
උපචිත වියදම් (වැඩි වීම)/(අඩු වීම)	(6,146,536)	(646,704)
	(86,454,808)	(15,914,203)
පාරිතෝෂික ගෙවීම්	(3,003,908)	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**31,237,926**	**(153,852,435)**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
දේපල පිරියත සහ උපකරණ මිලදී ගැනීම	(7,448,194)	(32,740,139)
දේපල පිරියත සහ උපකරණ විකිණීම	-	187,063
ලද කුලිය	1,777,823	2,370,000
ලද පොලී ආදායම	29,946,979	60,105,993
ආයෝජන (වැඩි වීම)/(අඩු වීම)	(11,072,026)	255,070,418
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**13,204,582**	**284,993,335**
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය		
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**-**	**-**
මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම	**44,442,508**	**131,140,899**
කාලපරිච්ඡේදය ආරම්භයේ දී මුදල් සහ හා මුදල් සමාන දෑ	**158,474,397**	**27,333,498**
කාලපරිච්ඡේදය අවසානයේ දී මුදල් සහ හා මුදල් සමාන දෑ	**202,916,905**	**158,474,397**

ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට

මුදල රු. වලින්

විස්තර	දායක ප්‍රාග්ධනය	සමුච්චිත අතිරික්තයන්/(හිඟයන්)	එකතුව
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	457,350,952	465,974,673	923,325,625
පෙර වර්ෂයේ ගැලපීම්	-	5,936,947	5,936,947
ප්‍රතිස්ථාපිත ශේෂය	457,350,952	471,911,620	929,262,572
කාල සීමාව සඳහා අතිරික්තය / (හිඟය)	-	112,016,893	112,016,893
2022 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය	**457,350,952**	**583,928,513**	**1,041,279,465**

ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය

2022 දෙසැම්බර් 31 දිනට

මුදල රු. වලින්

විස්තර	දායක ප්‍රාග්ධනය	සමුච්චිත අතිරික්තයන්/(හිඟයන්)	එකතුව
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	457,350,952	672,756,656	1,130,107,608
පෙර වර්ෂයේ ගැලපීම්	-	(24,422,081)	(24,422,081)
			-
ප්‍රතිස්ථාපිත ශේෂය	457,350,952	648,334,575	1,105,685,527
			-
කාල සීමාව සඳහා අතිරික්තය / (හිඟය)	-	(182,359,902)	(182,359,902)
2021 දෙසැම්බර් 31 දිනට ඉදිරියට ගෙන ආ ශේෂය	**457,350,952**	**465,974,673**	**923,325,625**

සටහන : 01

1. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්කරණ උපකල්පන සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති

1.1 වාර්තා කිරීමේ ආයතනය

ශ්‍රී ලංකා සංචාරක සහ හෝටල් කළමනාකරණ ආයතනය (SLITHM) 2005 අංක 38 දරන සංචාරක පනත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි.

1.2 ගිණුම්කරණ පදනම

SLITHM හි මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට (SLPSAS) අනුකූලව සකස් කර ඉදිරිපත් කර ඇති අතර ඓතිහාසික පිරිවැය පදනම හා අඛණ්ඩ පැවැත්ම යන සංකල්ප මත පදනම්ව පිළියෙල කර ඇත. ආදායම් සහ පිරිවැය උපචිත පදනම මත සහ අදාළ කාල සීමාව සඳහා මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර ඇත. සුදුසු අවස්ථාවලදී, සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන්වල විස්තර කර ඇත.

1.2.1 ගිණුම්කරණයේ උපචිත පදනම

මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළිබඳ තොරතුරු හැර, ගිණුම්කරණයේ උපචිත පදනම අනුගමනය කරමින් මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

1.2.2 සංසන්දනාත්මක තොරතුරු

වත්මන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තේරුම් ගත හැකි වන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය තැන් හී නැවත වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

1.2.3 අඛණ්ඩ පැවැත්ම

SLITHM හි කළමනාකාරිත්වය අඛණ්ඩව ඉදිරියට යාමට ඇති හැකියාව තක්සේරු කර ඇති අතර අපේක්ෂා කළ හැකි අනාගතයක් සඳහා ව්‍යාපාර කරගෙන යාමට සම්පත් ඇති බවට සෑහීමකට පත්වේ.

1.3 තොග

SLPSAS 09 ට අනුව, තොග පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගයෙන් වඩා අඩු අගයට මැනිය යුතුය. SLITHM විසින් තොග අගය කිරීම සඳහා පෙ.ලැ.පෙ.නි (FIFO) ක්‍රමය භාවිතා කරයි.

1.4 දේපල, පිරියත උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම්

SLITHM විසින් ප්‍රයෝජනවත් ජීවකාලය හා අවශේෂ වටිනාකම සලකා බලා, දේපල, පිරියත උපකරණ සහ අස්පෘශ්‍ය වත්කම් ක්ෂය කිරීමේ ක්‍රම, සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරයි. SLPSAS 07 යටතේ සපයා ඇති මාර්ගෝපදේශ සලකා බැලීමෙන් අගයන් සහ අනුපාත ඇස්තමේන්තු කිරීමේදී කළමනාකාරිත්වයේ විනිශ්චයන් ක්‍රියාත්මක වේ.

අනාගත ආර්ථික ප්‍රතිලාභ හා පරිභෝජන රටාව සැලකිල්ලට ගනිමින් දේපල, පිරියත සහ උපකරණ යන අයිතමවල එක් එක් කොටසෙහි ප්‍රයෝජනවත් ආයු කාලය පදනම්ව සරල රේඛීය ක්‍රමය මත වත්කම්වල පිරිවැය හෝ ප්‍රති තක්සේරුව මත පදනම්ව ක්ෂයවීම් ලබා දී ඇත. ක්ෂයවීම් අනුපාත පහත පරිදි වේ.

ගොඩනැගිලි	-	04.00%
ජල සම්පාදන හා ජලාපවහන පද්ධතිය	-	07.50%
විදුලි ස්ථාපනය	-	05.00%
දුරකථන සම්බන්ධ ස්ථාපනය	-	05.00%
වෑද්දුම් සහ සවිකිරීම්	-	07.50%
ගෘහභාණ්ඩ	-	07.50%
විවිධ උපකරණ	-	07.50%
කාර්යාල උපකරණ	-	10.00%
මුළුතැන්ගෙයි හා බේකරි උපකරණ	-	07.50%
විවිධ උපකරණ - ආහාර සහ පාන අංශය	-	07.50%
ගෘහ පාලන උපකරණ	-	07.50%
රෙදි සෝදන උපකරණ	-	07.50%
යන්ත්‍රෝපකරණ	-	25.00%
වීදුරු භාණ්ඩ සහ පිඟන් කෝප්ප	-	33.33%
හැඳි ගෑරුප්පු සහ රිදී භාණ්ඩ	-	25.00%
මුළුතැන්ගෙයි උපකරණ	-	25.00%
ලිනන් රෙදි	-	50.00%
මෝටර් රථ	-	25.00%
පරිගණක හා දත්ත සැකසුම් උපකරණ	-	25.00%
පරිගණක වැඩසටහන් හා මෘදුකාංග	-	33.33%
පුස්තකාල පොත්	-	33.33%

දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ අගයෙන් (**ගොඩනැගිලි හැර**) සමුච්චිත ක්ෂය අගය අඩුකර දක්වා ඇත. ගොඩනැගිලි පිරිවැයෙන් සමුච්චිත ක්ෂය සහ සමුච්චිත අගය අඩුවීමේ අලාභය අඩුකොට දක්වා ඇත.

1.4.1 නොනිමි වැඩ / ඉදි වෙමින් පවතින ව්‍යාපෘති

ඉදිවෙමින් පවතින ව්‍යාපෘති මඟින් නියෝජනය වන නොනිමි වැඩ වටිනාකම රු.17,270,187.

1.5 ආදායම් හඳුනා ගැනීම

SLPSAS 10 යටතේ සපයා ඇති මාර්ගෝපදේශ අනුව SLITHM හි ආදායම හඳුනා ගැනේ. පහත සඳහන් නිර්ණායක සපුරාලන විට මූලික මෙහෙයුම් ආදායම හඳුනා ගැනේ.

- ශිෂ්‍යයෙකු මූල්‍ය වර්ෂයක් ඇතුළත අදාළ පාඨමාලාව සම්පූර්ණ කළ විට, අදාළ කාලසීමාව සඳහා ආදායම් ප්‍රකාශනයේ ආදායම හඳුනා ගැනේ. කිසියම් නොගෙවූ පාඨමාලා ගාස්තුවක් මූල්‍ය තත්ත්වය ප්‍රකාශයේ ලැබිය යුතු ලෙස හඳුනාගෙන ඇත.
- පාඨමාලා කාලසීමාව මූල්‍ය වසර දෙකක් හෝ වැඩි ගණනක් වන විට, අදාළ මූල්‍ය වර්ෂයේ නියමිත මාස මත පදනම්ව ආදායම හඳුනා ගැනේ.
- අදාළ පාඨමාලා සම්පූර්ණ නොකළ සිසුන්, විෂය භාර සුදුසු විදුහල්පති/ කථිකාචාර්යවරයාගෙන් තහවුරු කිරීමත් සමඟින් ඉවත් වූ සිසුන් ලෙස සලකනු ලැබේ. අදාළ කාලපරිච්ඡේදයේ ආදායම ලෙස හඳුනාගනු ලබන්නේ එම කාලසීමාව තුළ හැර යන සිසුන් විසින් ගෙවන ගාස්තුව පමණි.

1.6 සේවක ප්‍රතිලාභ වගකීම

සේවා නියුක්ත වර්ෂයේ සිට සේවකයන් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂිකය සඳහා ගිණුම්වල ප්‍රතිපාදන සලසා ඇත. පහත සඳහන් කරුණු මත පදනම්ව ගණනය කිරීම් සිදු කරනු ලැබේ:

- සේවකයකු වසරක සේවා කාලය සම්පූර්ණ කළ පසු පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා සලකා බලනු ලැබේ.
- මූල්‍ය වර්ෂයේ අවසාන දිනයේ සේවකයෙකු සක්‍රීය සේවයේ නොමැති විට, අදාළ සේවකයා පාරිතෝෂික ප්‍රතිපාදන සඳහා නොසැලකේ.
- යම් සේවකයෙකු වසර පහක් සම්පූර්ණ වීමට පෙර ආයතනයෙන් ඉවත් වූ විට එහිදී එම සේවකයා වෙනුවෙන් කරන ලද අදාළ ප්‍රතිපාදනය අදාළ වර්ෂයේ පාරිතෝෂික ප්‍රතිපාදනයට එරෙහිව ගලපනු ලැබේ.

1.7 ප්‍රතිපාදන

SLPSAS 08 හි දක්වා ඇති මාර්ගෝපදේශ අනුව ප්‍රතිපාදනයක් හඳුනා ගනු ලැබේ.

1.7.1 බොල් ණය සඳහා ප්‍රතිපාදන / ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල්

SLITHM විසින් එක් එක් වාර්තාකරණ දිනයකදී ලැබිය යුතු මුදල් ආපසු අයකර ගැනීමේ හැකියාව සාමූහිකව තක්සේරු කරන අතර කළමනාකාරිත්වයේ විනිශ්චය මත අයකර ගැනීමේ කාලය මත පදනම්ව ප්‍රතිපාදන වෙන් කිරීම සිදු කරයි. වෙන් කිරීම පහත පරිදි සිදු කෙරේ.

ණයගැතියන්ගේ කාලසීමාව (මාස අනුව)	ප්‍රතිපාදන අනුපාතය
0 - 12	0%
13 - 24	5%
25 +	10%

දේපල, පිරියත සහ උපකරණ
2022 දෙසැම්බර් 31 දිනට

සටහන : 01
මුදල රු. වලින්

ස්පෘශ්‍ය වත්කම්

ගිණුම් කේතය/ලෙජර් අංකය.	විස්තරය	2022/01/01 දිනට ශේෂය	එකතු කිරීම්	2022/12/31 දිනට ශේෂය	2022/01/01 දිනට සමුච්චිත ක්ෂයවීම්	ක්ෂයවීම් 2022	2022/12/31 දිනට සමුච්චිත ක්ෂයවීම්	ශුද්ධ පොත් අගය
102	ගොඩනැගිල්ල	403,365,439.97	1,722,929.15	405,088,369.12	188,822,613.43	16,170,466.27	204,993,079.70	200,095,289.41
103	ජල සම්පාදන සහ ජලාපවහන පද්ධතිය	1,873,600.00	-	1,873,600.00	233,811.00	140,520.00	374,331.00	1,499,269.00
104	විදුලි ස්ථාපනය	1,228,140.00	-	1,228,140.00	109,903.00	61,407.00	171,310.00	1,056,830.00
105	දුරකථන සන්නිවේදන ස්ථාපනය	9,980,272.11	341,256.00	10,321,528.11	545,707.00	499,549.86	1,045,256.86	9,276,271.25
106	වෑද්දුම් සහ සවි කිරීම්	65,571,167.04	1,558,991.00	67,130,158.04	8,774,160.00	4,918,842.24	13,693,002.24	53,437,155.80
107	ගෘහභාණ්ඩ	68,134,297.80	-	68,134,297.80	9,379,321.00	5,110,072.34	14,489,393.34	53,644,904.47
108	විවිධ උපකරණ	27,111,777.16	934,419.07	28,046,196.23	4,005,192.00	2,060,223.41	6,065,415.41	21,980,780.82
109	කාර්යාල උපකරණ	6,477,308.86	-	6,477,308.86	1,267,615.00	647,730.89	1,915,345.89	4,561,962.97
110	මුළුතැන්ගෙයි සහ බේකරි උපකරණ	52,948,554.35	123,630.00	53,072,184.35	7,572,503.00	3,974,469.62	11,546,972.62	41,525,211.73
111	වෙනත් උපකරණ - ආහාර හා පාන	7,481,242.88	-	7,481,242.88	1,009,221.00	561,093.22	1,570,314.22	5,910,928.66
112	ගෘහ පාලන උපකරණ	9,900,546.27	-	9,900,546.27	1,339,625.00	742,540.97	2,082,165.97	7,818,380.30
113	රෙදි සෝදන උපකරණ	12,133,650.00	-	12,133,650.00	1,779,585.00	910,023.75	2,689,608.75	9,444,041.25
114	පිරියත සහ යන්ත්‍රෝපකරණ	28,137,944.93	-	28,137,944.93	14,017,161.00	7,034,486.23	21,051,647.23	7,086,297.70
115	වීදුරු භාණ්ඩ සහ පිඟන් භාණ්ඩ	4,055,811.20	540,069.20	4,595,880.40	2,419,955.00	1,454,232.38	3,874,187.38	721,693.02
116	හැඳි ගෑරුප්පු සහ රිදී භාණ්ඩ	3,153,391.01	120,200.00	3,273,591.01	1,532,761.00	817,689.00	2,350,450.00	923,141.01
117	මුළුතැන්ගෙයි උපකරණ	9,261,937.92	114,850.00	9,376,787.92	4,307,571.00	2,338,847.80	6,646,418.80	2,730,369.12
118	රෙදිපිළි	7,085,732.67	150,850.00	7,236,582.67	6,904,877.00	232,065.62	7,136,942.62	99,640.05
119	මෝටර් රථය	15,800,000.00	-	15,800,000.00	7,900,000.00	3,950,000.00	11,850,000.00	3,950,000.00
120	පරිගණක සහ දත්ත සැකසුම් උපකරණ	34,938,792.51	247,400.00	35,186,192.51	16,206,674.00	8,775,343.30	24,982,017.30	10,204,175.21
121	පුස්තකාල පොත්	7,987,353.07	5,200.00	7,992,553.07	5,026,811.00	2,663,827.72	7,690,638.72	301,914.35
		776,626,959.75	**5,859,794.42**	**782,486,754.17**	**283,155,066.43**	**63,063,431.60**	**346,218,498.03**	**436,268,256.13**

අස්පෘශ්‍ය වත්කම්

ගිණුම් කේතය/ලෙජර් අංකය.	විස්තරය	2022/01/01 දිනට ශේෂය	එකතු කිරීම්	2022/12/31 දිනට ශේෂය	2022/01/01 දිනට සමුච්චිත ක්‍රමක්ෂය	2022 සඳහා ක්‍රමක්ෂය කිරීම	2022/12/31 දිනට සමුච්චිත ක්‍රමක්ෂය	ශුද්ධ පොත් අගය
122	පරිගණක වැඩසටහන් සහ මෘදුකාංග	2,255,112.00	975,000.00	3,230,112.00	1,413,538.00	950,704.81	2,364,242.81	865,869.19

සටහන : 03

තොග ශේෂය

මුදල රු. වලින්

විස්තරය	2022	2021 (ප්‍රතිස්ථාපිත)	2021
මත්පැන් තොගය	-	83,540	83,540
ප්‍රධාන ගබඩා	3,940,298.00	3,923,058	3,923,058
(-) තොග අලාභය සඳහා වෙන්කිරීම	158,946.00	158,946	158,946
එකතුව	**3,781,352**	**3,847,652**	**3,847,652**

සටහන : 04

වෙළඳ ණයගැතියන්

මුදල රු. වලින්

කාල සීමාව (මාස)	2022	2021 (ප්‍රතිස්ථාපිත)	2021
6 ට අඩු	3,700,658	553,339	553,339
6 ට වැඩි සහ 12 ට අඩු	106,938	53,924	53,924
12 ට වැඩි සහ 18 ට අඩු	77,920	42,674	42,674
18 ට වැඩි සහ 24 ට අඩු	40,924	97,629	97,629
24 ට වැඩි	20,540,911	22,008,454	22,008,454
එකතුව	**24,467,350**	**22,756,021**	**22,756,021**

සටහන : 05

තැන්පතු සහ වෙනත් ලැබිය යුතු මුදල්

මුදල රු. වලින්

විස්තරය	2022	2021 (ප්‍රතිස්ථාපිත)	2021
සංචාරක පොලිස් ඒකකය - ගොඩනැගිලි කුලි	3,192,000	3,192,000	3,192,000
CHSGA (ගොඩනැගිලි කුලිය 2016-2020)	1,591,800	1,651,800	1,651,800
CHSGA (ගොඩනැගිලි කුලිය 2021-2022)	872,906	-	-
SLCB (ගොඩනැගිලි කුලිය 01/2018- 12/2018)	330,000	330,000	330,000
SLCB (සේවක නිල ඇඳුම්)	31,958	12,225	12,225
සිසුන් - රත්නපුර	184,980	184,980	184,980
ලැබිය යුතු WHT	24,000	24,000	24,000
ස්ථාවර තැන්පතු පොලී	37,108,006	7,899,313	7,899,313
ඉන්ධන සඳහා C F De Mel තැන්පතු	375,000	250,000	250,000
ආරක්ෂක තැන්පතු - ලංවිම	3,027,500	3,027,500	3,027,500
කොරෝනා කාලපරිච්ඡේදය තුළ නිකුත් කරන ලද තොග	-	-	4,183
Koala (Pvt) Ltd	370,976	370,976	370,976
Jaykay Marketing	750,000	500,000	500,000
Cargills Food City	3,500,000	2,000,000	2,000,000
ලැබිය යුතු/ගෙවිය යුතු පාසල් ගාස්තු	2,703,600	4,851,400	3,904,900
(-) හඳුනා නොගත් තැන්පතු	(931,161)	(2,137,324)	(2,138,824)
ජීවන වියදම් (අධි) ගෙවීම	149,272	173,272	173,272
13 වසර වැඩසටහන	9,042,400	3,637,636	3,637,636
එකතුව	**62,323,237**	**25,967,778**	**25,023,961**

සටහන : 06

ලැබිය යුතු දෑ – ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA)

මුදල රු. වලින්

විස්තරය	2022	2021 (ප්‍රතිස්ථාපිත)	2021
ආපදා ණය	54,400	54,400	54,400
උපචිත වියදම් - 2007	3,810,324	3,810,324	3,810,324
ආපදා ණය - එන්.ටී.එන්. සරසිංහ මිය	168,445	168,445	168,445
ආපදා ණය - ඩබ්.එම්. සිරිපාල මයා	184,320	184,320	184,320
ආපදා ණය - කේ. ගණේෂ් මයා	161,520	161,520	161,520
ආපදා ණය - එම්.ආර්.ඒ.එස්. පීරිස් මයා	104,890	104,890	104,890
එස්. සමරවීර මහතාගේ වැටුප සැප්තැම්බර්/2010 - දෙසැම්බර්/2011	349,443	349,443	349,443
සභාපති බී.ගුණතිලක - කොරියානු සංචාරය	237,576	237,576	237,576
සංචාරක සංවර්ධන බද්ද	51,733,539	23,803,151	23,803,151
අපගමන බද්ද	73,823,558	37,197,095	37,197,095
2008 ජුනි සේවක අර්ථසාධක අරමුදල	22,039	22,039	22,039
නඩත්තු කාර්ය මණ්ඩලය සඳහා අතිකාල 2012/2013	303,822	303,822	303,822
සංචාරක සේවකයින් සඳහා විශේෂ අලුත් අවුරුදු ත්‍යාගය	-	378,000	378,000
එකතුව	**130,953,875**	**66,775,024**	**66,775,024**

සටහන : 07

ණය සහ වෙනත්

මුදල රු. වලින්

විස්තරය	2022	2021 (ප්‍රතිස්ථාපිත)	2021
ආපදා ණය	14,643,647	12,201,038	12,201,038
විශේෂ ණය	335	335	335
උත්සව අත්තිකාරම්	160,000	170,400	170,400
එකතුව	**14,803,982**	**12,371,773**	**12,371,773**

හිඟ අත්තිකාරම්

සාමාන්‍ය

සටහන : 08

මුදල රු. වලින්

අත්තිකාරම් අංකය	නම	විස්තරය	මුදල
71 (2015)	එම්. ප්‍රනාන්දු	නත්තල් කැරොල් සඳහා අත්තිකාරම්	60,000
73	නුවන් විරාජ්	පෑන් සහ හැඳි	15,000
89	ආර්. ප්‍රනාන්දු	QB මෘදුකාංග බලපත්‍රය	136,000
90	ශාන්තිනී හපුගොඩ	මල් පැළ, ආදිය	75,000
10	එස්. ලොකුහෙට්ටිගේ	කෝපි යන්ත්‍රයේ වාර සේවාව	47,898
එකතුව			**333,898**

සටහන : 09

පෙර / ඉදිරියට කරන ලද ගෙවීම්

මුදල රු. වලින්

නම	විස්තරය	මුදල
බණ්ඩාරවෙල		
Metropolitan Technologies (Pvt) Ltd	192 - සේවා ගිවිසුම | 20/10/22-19/10/23	17,964.11
එකතුව		**17,964.11**
කොළඹ		
John Keells Office Automation (Pvt) Ltd	71 - සේවා ගිවිසුම - Toshiba ඡායා පිටපත් යන්ත්‍රය	12,988.00
Tudawe Engineering Services (Pvt) Ltd	625 - සේවා ගිවිසුම - මධ්‍යම වායු සමීකරණ පද්ධතිය | 28/03/22-28/03/23	43,445.00
LOLC General Insurance Ltd	1440 - ගිනි රක්ෂණ ආවරණය	285,167.00
John Keells Office Automation (Pvt) Ltd	1664 - සේවා ගිවිසුම - Toshiba ඡායා පිටපත් යන්ත්‍රය | 21/12/22-20/12/23	24,295.10
භාණ්ඩාගාරික කොළඹ මහ නගර සභාව	1749 - වරිපනම් බදු ගෙවීම 2023	1,663,200.00
එකතුව		**2,029,095.74**
මහනුවර		
Metropolitan Technologies (Pvt) Ltd	357 - සේවා ගිවිසුම | 01/11/22-31/10/23	89,892.00
එකතුව		**89,892.00**
කොග්ගල		
Protek Solutions (Pvt) Ltd	94 - සේවා ගිවිසුම | 21/02/22-20/02/23	6,342.86
E-W Information System Ltd	321 - සේවා ගිවිසුම - E-Wis පරිගණක | 09/11/22-08/11/23	309,925.00
Iceman Technologies (Pvt) Ltd	336 - සේවා ගිවිසුම - සිසිල් කාමරයේ ශීතකරණය	49,680.00
එකතුව		**365,947.86**
කුරුණෑගල		
Sperry's Commercial Equipment (Pvt) Ltd	99 - මුළුතැන්ගෙයි උපකරණ වාර සේවාව	26,468.13
Metropolitan Technologies (Pvt) Ltd	236 - සේවා ගිවිසුම - ඡායා පිටපත් යන්ත්‍රය | 16/08/22-15/08/23	16,694.02
එකතුව		**43,162.15**
රත්නපුරය		
LOLC General Insurance Ltd	202 - ගිනි රක්ෂණ ආවරණය	95,720.65
E-W Information System Ltd	208 - සේවා ගිවිසුම | 09/11/22-08/11/23	382,240.82
Metropolitan Technologies (Pvt) Ltd	210 - සේවා ගිවිසුම - Canon ඡායා පිටපත් යන්ත්‍රය	13,855.48
Gestetner of Ceylon PLC	243 - වාර්ෂික නඩත්තු ගිවිසුම	18,064.58
එකතුව		**509,881.53**
මුලු එකතුව		**3,055,943.39**

මුදල් පොත සහ බැංකු ශේෂ

2022 දෙසැම්බර් 31 දිනට

සටහන : 10

මුදල රු. වලින්

බැංකු ශාඛාව	ගිණුම් අංකය	2022		2021	
		මුදල් පොත් ශේෂය	බැංකු ශේෂය	මුදල් පොත් ශේෂය	බැංකු ශේෂය
ලංකා බැංකුව - අනුරාධපුර	7120455	291,126.15	1,004,500.00	172,897.00	1,004,500.00
ලංකා බැංකුව - බණ්ඩාරවෙල	7120413	493,452.06	1,000,000.00	123,024.00	1,000,000.00
ලංකා බැංකුව - කොළඹ	7120156	(7,612,221.10)	1,998,500.00	(9,680,761.00)	1,998,500.00
ලංකා බැංකුව - මහනුවර	7120392	(370,169.60)	1,000,000.00	255,661.00	1,000,000.00
ලංකා බැංකුව - කොග්ගල	7120471	(839,145.40)	1,000,000.00	(648,969.00)	1,000,000.00
ලංකා බැංකුව - රත්නපුර	71114301	235,532.32	1,000,000.00	12,534.00	1,000,000.00
ලංකා බැංකුව - කුරුණෑගල	77110931	326,119.72	1,000,000.00	438,690.00	1,000,000.00
ලංකා බැංකුව- මඩකලපුව	78651957	880,219.05	1,000,000.00	973,753.00	1,000,000.00
ලංකා බැංකුව - යාපනය	87450273	96,217.65	338,139.00	757,735.00	869,716.00
ලංකා බැංකුව - අරමුදල් කළ.ගි.	87163924	179,412,105.00	179,412,105.00	31,069,448.00	31,069,448.00
ලංකා බැංකුව - නැවත මිලදී ගැනීමේ ගිවිසුම් මත (REPO) ස්ථානගත කිරීම්		-	-	-	-
LKB01025C157 (යොමුව 1967752)		30,000,000.00	30,000,000.00	35,000,000.00	35,000,000.00
		-	-	100,000,000.00	100,000,000.00
සුළු මුදල්		3,670.00	-	385.00	-
එකතුව		**202,916,905.85**	**218,753,244.00**	**158,474,397.00**	**175,942,164.00**

මුදල් පොත් ශේෂ විශ්ලේෂණය

මුදල රු. වලින්

විස්තරය	මුදල් පොත් ශේෂය 2022	මුදල් පොත් ශේෂය 2021
ධන ශේෂ - මුදල් සහ මුදල් සමාන දෑ	211,738,442	168,804,128
සෘණ මුදල් පොත (බැංකු) ශේෂයන්	(8,821,536)	(10,329,730)
අවසාන ශේෂය	**202,916,905**	**158,474,397**

සටහන : 11

නොනිමි වැඩ

මුදල රු. වලින්

සැපයුම්කරු / කොන්ත්‍රාත්කරුගේ නම	විස්තරය	මුදල
Apec Holdings (Pvt) Ltd	කොළඹ SLITHM හි 4 වෙනි මහලේ පුස්තකාලයේ ප්‍රතිසංස්කරණ වැඩ	6,268,941
Pragmatic International	බිම් මහල මුළුතැන්ගෙයි අලුත්වැඩියා කටයුතු	215,248
Datamation System (Pvt) Ltd	මෘදුකාංග පැකේජය	3,771,216
Headstart (Pvt) Ltd.	ශිෂ්‍ය කළමනාකරණ පද්ධතිය සඳහා ගෙවීම්	2,340,000
Science Land Software (Pvt) Ltd.	ගබඩා කළමනාකරණ පද්ධතිය	990,000
Dinuja Engineering Services (Pvt) Ltd.	LG කාන්තා ටොෂ්රූම් අලුත්වැඩියා කටයුතු සඳහා ගෙවීම	459,217
Master Builders	පුස්තකාලය ප්‍රතිසංස්කරණය	427,680
Green Light LK	දෙවෙනි මහලේ යාන්ත්‍රික වාතාශ්‍රකරණ පද්ධතියක් ස්ථාපිත කිරීම	3,411,285
එකතුව		**17,883,587**

සටහන : 12

කෙටි කාලීන ආයෝජන

මුදල රු. වලින්

කෙටි කාලීන ආයෝජන තැන්පතු දිනය	කාලය	ස්ථාවර තැන්පතු අංකය	තැන්පතු මුදල	අවසාන අලුත් කිරීමේ දිනය	තැන්පතු/අවසාන අලුත් කිරීමේ මුදල	වාර්ෂික පොලී අනුපාතය
05/05/2022	මාස 12	88908183	200,000,000	-	200,000,000	24.50%
05/05/2022	මාස 6	88908155	100,000,000	08/11/2022	112,295,890	24.00%
එකතුව					**312,295,890**	

සටහන : 13

තැන්පතු සහ වෙනත් ගෙවිය යුතු දෑ

මුදල රු. වලින්

විස්තරය	2022	2021 (ප්‍රතිස්ථාපිත)	2021
ගෙවිය යුතු තැන්පතු	2,076,872	2,403,000	2,403,000
හානි සඳහා වෙන් කිරීම	546,689	546,689	546,689
සේවා ගාස්තු	501,080	322,207	322,207
STTANP	1,944,465	1,944,465	1,944,465
ILO ව්‍යාපෘතිය	3,191,142	4,878,705	4,878,705
ගෙවිය යුතු වැට් බදු	1,452,439	1,452,439	1,452,439
ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු	3	3	3
සේවක අර්ථසාධක අරමුදල	2,590,931	2,758,164	2,758,164
සේවක භාරකාර අරමුදල	310,912	330,980	330,980
උපයන විට ගෙවීමේ බදු	2,558	2,558	2,558
ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත්	-	110,478	110,478
ප්‍රාග්ධන ව්‍යාපෘති සඳහා රැඳවුම්	1,215,900	1,598,976	1,598,976
වැටුප් අයකර ගැනීම (බැංකු ණය)	75,376	29,403	29,403
රක්ෂණය (වැටුප් අයකර ගැනීම)	2,250	1,000	1,000
SLITHM සුබසාධන දායකත්වය	0	1	1
අත්තිකාරම් ලැබීම් - සමුද්‍රා හෝටලය	68,890	58,889	893,954
පරිත්‍යාග	570,585	618,735	618,735
එකතුව	**14,550,092**	**17,056,693**	**17,891,758**

සටහන : 14

පාරිතෝෂිතය සඳහා ප්‍රතිපාදන සාරාංශය - 2022

මුදල රු. වලින්

	2022	2021
ඉදිරියට ගෙන ආ මුදල	53,969,802	48,261,587
එකතු කළා:		
වර්ෂය සඳහා ප්‍රතිපාදනය	6,170,198	5,708,215
	60,140,000	**53,969,802**
අඩු කළා:		
2021 වර්ෂය තුළ ගෙවන ලද මුදල	3,003,908	-
2021.12.31 දිනට ගෙවිය යුතු මුළු පාරිතෝෂිතය	**57,136,092**	**53,969,802**
අඩු කළා : පාරිතෝෂිතය සඳහා ආයෝජනය	17,365,170.74	16,868,282
සේවා නියුක්ති ප්‍රතිලාභ වගකීම	**39,770,921**	**37,101,520**

සටහන : 15

ප්‍රධාන ආදායම

මුදල රු. වලින්

	සටහන	2022	2021	අයවැය 2022
සංචාරක සංවර්ධන බදු ආදායම (TDL)		145,102,021	88,207,034	221,917,350
අපගමන බද්ද (EL)		311,743,267	58,077,386	119,493,958
එකතුව		**456,845,289**	**146,284,420**	**341,411,308**

සටහන : 16

පාසල් ගාස්තු ආදායම

මුදල රු. වලින්

	සටහන	2022	2021	අයවැය 2022
පාසල් ගාස්තු	I	90,490,811	55,747,636	53,750,000
සංචරණ සහ සංචාරක (සංචාරක මාර්ගෝපදේශ වැඩසටහන)	II	19,503,065	25,060,000	20,000,000
එකතුව		**109,993,876**	**80,807,636**	**73,750,000**

සටහන : 17

වෙනත් ආදායම්

මුදල රු. වලින්

	සටහන	2022	2021	අයවැය 2022
උපදේශන ගාස්තුව		-	-	-
කුලි ආදායම්-ගොඩනැගිලි		2,590,729	2,247,000	5,882,266
බැංකු පොලී ආදායම		59,155,672	32,625,047	50,000,000
ලොන්ඩ්‍රියෙන් ලද ආදායම		-	968,222	5,000,000
වෙන්දේසියෙන් ලද මුදල්		-	-	-
සේවක ණය සඳහා පොලී		536,682	533,192	600,000
වත්කම් අපහරණය මත ලාභය		-	166,939	-
වෙනත් ආදායම්		3,024,589	1,486,005	1,775,000
එකතුව		**65,307,672**	**38,026,405**	**63,257,266**

සටහන : 18

වැටුප් සහ සේවක ප්‍රතිලාභ

මුදල රු. වලින්

	සටහන	2022	2021	අයවැය 2022
වැටුප් සහ දීමනා		159,940,419	148,432,891	172,000,000
නිවාඩු දීමනා		235,693	220,699	500,000
අමතර පැය ගෙවීම්		3,291,250	162,375	7,000,000
විභාග ගෙවීම්		4,212,763	1,213,994	2,500,000
අතිකාල		2,499,918	2,231,709	3,000,000
සේවක අර්ථසාධක අරමුදල		17,570,824	17,814,900	25,800,000
සේවක භාරකාර අරමුදල		3,514,165	3,562,980	5,160,000
කාර්ය මණ්ඩල දිරිදීමනා		5,622,012	5,963,807	7,892,500
කාර්ය මණ්ඩල වෛද්‍ය රක්ෂණය		16,694,869	20,183,818	17,200,000
කාර්ය මණ්ඩල සුබසාධනය		1,745,761	1,840,982	500,000
දේශීය ගමන්		489,254	132,314	500,000
විදේශීය ගමන්		-	-	-
කාර්ය මණ්ඩල නිල ඇඳුම්		988,648	945,946	1,060,000
බාහිර කථිකාචාර්ය ගාස්තු		17,663,958	14,460,968	15,000,000
කාර්ය මණ්ඩල පුහුණුව සහ සංවර්ධනය		974,800	904,830	1,000,000
පැමිණීමේ දීමනා		8,716,226	5,156,054	500,000
සේවක පාරිතෝෂිතය		5,724,067	5,708,215	-
එකතුව		**249,884,628**	**228,936,481**	**259,612,500**

සටහන: *විභාග ගෙවීම්වලට ප්‍රශ්න පත්‍ර සලකුණු කිරීම, ප්‍රශ්න පත්‍ර සැකසීම, ප්‍රශ්න සකස් කිරීම, පරීක්ෂා කිරීම, නැවත නිවැරදි කිරීම, ප්‍රායෝගික විභාග, මාර්ගගත පරීක්ෂණ, වාචික පරීක්ෂණ ආදිය සඳහා කරන ලද ගෙවීම් ඇතුළත් වේ.*

සටහන : 19

කෙටි කාලීන ආයෝජන

මුදල රු. වලින්

	සටහන	2022	2021	අයවැය 2022
ආරක්ෂක සේවා		15,479,810	16,764,964	17,000,000
පිරිසිදු කිරීමේ සැපයුම් සහ සේවා		16,893,050	16,244,834	20,000,000
විදුලිය		27,948,885	19,755,817	42,212,994
ගෑස්		3,569,219	1,105,206	5,000,000
ජලය		3,537,796	1,899,605	3,581,817
දුරකථන සහ අන්තර්ජාලය		4,648,834	4,193,725	4,693,589
ලිපිද්‍රව්‍ය		2,412,327	752,687	3,000,000
තැපැල් ගාස්තු, මුද්දර සහ විදුලි පණිවුඩ		718,186	443,629	750,000
ඉඩම් සහ ගොඩනැගිලි කුලී		2,890,000	2,429,957	3,000,000
කාර්යාල උපකරණ නඩත්තු කිරීම		2,932,927	1,051,688	3,500,000
වෑද්දුම් සහ සවි කිරීම් නඩත්තු කිරීම		3,062,861	3,420,414	1,500,000
ගෘහ භාණ්ඩ නඩත්තු කිරීම		71,902	93,150	1,642,000
මෝටර් රථ නඩත්තු කිරීම		4,648,531	2,423,762	2,000,000
ගොඩනැගිලි නඩත්තු කිරීම		11,366,866	3,351,218	10,500,000
මුළුතැන්ගෙයි උපකරණ නඩත්තු කිරීම		2,938,790	1,233,627	5,000,000
වෙනත් උපකරණ නඩත්තු කිරීම		2,248,452	694,760	5,000,000
තොරතුරු තාක්ෂණ උපකරණ නඩත්තු කිරීම		2,242,335	42,500	2,700,000
ස්ථාවර වත්කම් රක්ෂණය		257,868	136,152	1,700,000
වරිපනම් බදු සහ බලපත්‍ර ගාස්තු		2,875,495	1,204,218	1,000,000
ප්‍රවාහන සහ භාණ්ඩ ප්‍රවාහන		168,299	23,370	250,000
ආයතනික සංග්‍රහ වියදම්		188,510	31,786	500,000
තොරතුරු තාක්ෂණ අයිතම සඳහා වියදම්		4,430,592	3,249,904	10,000,000
කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සඳහා වියදම්		42,750	297,000	505,000
වාහන කුලී වියදම්		9,904,978	9,298,523	12,982,586
ඉන්ධන සහ තෙල් සඳහා වියදම්		4,575,776	1,962,120	7,500,000
මුද්‍රණ සහ ප්‍රකාශන වියදම්		2,209,684	1,858,094	2,416,000
ප්‍රචාරණ වියදම්		2,718,988	3,360,119	2,300,000
උත්සව සහ ප්‍රවර්ධන වියදම්		837,107	315,257	3,600,000
සිසු උත්සව/ උපාධි ප්‍රදානෝත්සවය සඳහා වියදම්		2,848,182	4,023,584	5,000,000
සිසුන්ගේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් සඳහා අමුද්‍රව්‍ය මිලදී ගැනීම්		42,953,625	16,729,024	55,000,000
ලොන්ඩ්‍රි වියදම්		2,968,123	413,100	1,500,000
වෙනත් වියදම්		1,581,967	3,063,917	2,000,000
අලංකරණ වියදම්		58,900	15,300	25,000
සංචරණ සහ සංචාරක වියදම්		7,247,026	7,384,780	10,000,000
පොත් හා සඟරා		248,240	147,341	534,000
විශේෂ වැඩසටහන් සඳහා වූ වියදම්		-	-	-
විකතු කළ අගය මත බදු වියදම්		-	-	-
එකතුව		**193,726,882**	**129,415,133**	**247,892,986**

සටහන : 20

ක්ෂය සහ ක්‍රමක්ෂය වියදම්

මුදල රු. වලින්

	සටහන	2022	2021	අයවැය 2022
ක්ෂය - ගොඩනැගිලි		16,170,466	16,123,332	-
ක්ෂය - ජල සම්පාදන සහ ජලාපවහන පද්ධතිය		140,520	124,492	-
ක්ෂය - විදුලි සවි කිරීම්		61,407	59,889	-
ක්ෂය - දුරකථන සවි කිරීම්		499,550	421,639	-
ක්ෂය - වෑද්දුම් හා සවිකිරීම්		4,918,842	4,720,013	-
ක්ෂය - ලී බඩු		5,110,072	5,108,709	-
ක්ෂය - විවිධ උපකරණ		2,060,223	2,031,867	-
ක්ෂය - කාර්යාල උපකරණ		647,731	645,448	-
ක්ෂය - මුළුතැන්ගෙය හා බේකරි උපකරණ		3,974,470	3,894,089	-
ක්ෂය - විවිධ උපකරණ - ආහාර හා පාන		561,093	533,883	-
ක්ෂය - ගෘහ පාලන උපකරණ		742,541	742,541	-
ක්ෂය - රෙදි සෝදන උපකරණ		-	910,024	-
ක්ෂය - පිරියත හා උපකරණ		7,034,486	7,013,411	-
ක්ෂය - වීදුරු භාණ්ඩ සහ පිඟන් භාණ්ඩ		1,454,232	1,316,019	-
ක්ෂය - හැඳි ගෑරුප්පු සහ රිදී භාණ්ඩ		817,689	785,524	-
ක්ෂය - මුළුතැන්ගෙයි උපකරණ		2,338,848	2,244,117	-
ක්ෂය - රෙදිපිළි		232,066	3,539,463	-
ක්ෂය - මෝටර් වාහන		3,950,000	3,950,000	-
ක්ෂය - පරිගණක දත්ත සැකසුම් උපකරණ		8,775,343	8,547,234	-
ක්ෂය - පුස්තකාල පොත්		2,663,828	2,646,883	-
ක්ෂය - පරිගණක වැඩසටහන් සහ මෘදුකාංග		950,705	743,113	-
එකතුව		**63,104,113**	**66,101,690**	**-**

සටහන : 21

වෙනත් වියදම්

මුදල රු. වලින්

	සටහන	2022	2021	අයවැය 2022
සිසුන් සඳහා ශිෂ්‍යත්ව		2,503,000	699,000	2,000,000
අධ්‍යක්ෂ මණ්ඩල දීමනා		807,500	884,000	1,500,000
නීති සහ විගණන ගාස්තු		501,860	675,675	1,272,200
වත්කම් සත්‍යාපනය/ සමීක්ෂණ මණ්ඩලය		18,600	150,000	500,000
ස්ථාවර වත්කම් අපහරණය		-	-	-
පාඩු/ ලියා හැරීම්		(23,997)	200,950	-
එකතුව		**3,806,963**	**2,609,625**	**5,272,200**

සටහන : 22

මූල්‍ය වියදම්

මුදල රු. වලින්

	සටහන	2022	2021	අයවැය 2022
බැංකු ගාස්තු		152,723	158,084	400,000
එකතුව		**152,723**	**158,084**	**400,000**

සටහන - I

පාසල් ගාස්තු ආදායම පහත උප කාණ්ඩ වලින් සමන්විත වේ - සහතික පත්‍ර පාඨමාලා ගාස්තු, ශිල්පීය පාඨමාලා ගාස්තු, අන්තර් මධ්‍ය පාඨමාලා ගාස්තු, උසස් පාඨමාලා ගාස්තු, පේස්ට්‍රි සහ බේකරි ගාස්තු යනාදිය.

සටහන - II

සංචරණ සහ සංචාරක ආදායමට සංචාරක මාර්ගෝපදේශ වැඩසටහන් පැවැත්වීමෙන් ලැබෙන ආදායම ඇතුළත් වේ.

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ, ආරම්භක රඳවාගත් ඉපැයීම් රු.5,936,947 පහත දැක්වෙන පරිදි 2021 වර්ෂයේ ආදායම් සහ වියදම්වල වෙනස්කම් නියෝජනය කරයි.

මුදල රු. වලින්

විස්තරය	2021	සටහන	ගැලපීම	2021 (ප්‍රතිස්ථාපිත)
සංචාරක සංවර්ධන බද්ද (TDL)	88,207,034		-	88,207,034
අපගමන බද්ද (EL)	58,077,386		-	58,077,386
පාසල් ගාස්තු සහ වෙනත්	79,885,136	I	922,500	80,807,636
වෙනත් ආදායම්	37,892,628	II	133,777	38,026,405
හෝටල් ආදායම	(15,155,469)	III	835,065	(14,320,404)
මුළු ආදායම	**248,906,715**		**1,891,342**	**250,798,057**
වේතන, වැටුප් සහ සේවක ප්‍රතිලාභ	230,822,587	IV	(1,886,107)	228,936,480
පරිපාලන සහ ආයතන වියදම්	131,527,656	V	(2,112,523)	129,415,133
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය වියදම්	66,101,690			66,101,690
වෙනත් වියදම්	2,656,600	VI	(46,975)	2,609,625
මූල්‍ය වියදම්	158,084			158,084
මුළු වියදම	**431,266,617**		**(4,045,605)**	**427,221,012**
අතිරික්තය / (හිඟය)	**(182,359,902)**		**5,936,947**	**(176,422,955)**

සටහන - I

අඩුවෙන් ප්‍රතිපාදනය කළ ලැබිය යුතු පාසල් ගාස්තු මුදල් සඳහා ගැලපීම් සිදු කර ඇත.

සටහන - II

වාර්තා නොකළ බැංකු පොලී ආදායම සඳහා ගැලපීම් සිදු කර ඇත.

සටහන - III

ආපනශාලා අලෙවිය මත ලද අත්තිකාරම් සඳහා ගැලපීම් සිදු කර ඇත.

සටහන - IV

ගෙවීම සඳහා ඉල්ලුම් නොකළ පරීක්ෂා කිරීමේ ගාස්තු, ප්‍රශ්නපත්‍ර ලකුණු කිරීමේ ගාස්තු හා බාහිර කථිකාචාර්ය ගාස්තු සඳහා ගැලපීම් සිදු කර ඇත.

සටහන - V

අධි වෙන් කිරීම් කළ උපචිත වියදම් සහ කාර්යාලයීය සංග්‍රහ වියදම් සඳහා ලැබිය යුතු ශේෂය සඳහා ගැලපීම් සිදු කර ඇත.

සටහන - VI

අධි වෙන් කිරීම් කළ වත්කම් සත්‍යාපන වියදම් සඳහා ගැලපීම් සිදු කර ඇත.

6. මූල්‍ය ප්‍රකාශන

9.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා සංචාරක හා හෝටල් කළමනාකරණ ආයතනයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

9.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

9.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල නොවීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 07 හි අංක 13 සහ 26 ඡේදවලට අනුව, ආයතනය විසින් මේ දක්වා ප්‍රයෝජනයට ගන්නා කොළඹ සහ අනුරාධපුර ඉඩම් දෙකක සාධාරණ වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි. තවද, එම ඉඩම්වල අයිතිය ආයතනය නමින් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශනවල ඉහත ඉඩම් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමක් සිදු කර නොතිබුණි.

9.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

ඇ) 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා ඇති 2022 දෙසැම්බර් 31 දිනට රු.3,940,298 ක් වූ භෞතිකව සත්‍යාපනය කරන ලද තොගය, තොග වාර්තාවල ශේෂයන් සමඟ සංසන්දනය කිරීමට සහ විචලතා හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ආ) 2022 දෙසැම්බර් 31 දිනට භෞතික තොග සත්‍යාපනය කිරීමේදී තොග අයිතම 238 ක පිරිවැය හඳුනාගෙන නොතිබුණි. ඒ අනුව ආයතනයේ ජංගම වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

ඈ) සංචාරක පොලිස් ඒකකයෙන් 2014 වර්ෂයේදී ලැබිය යුතු රු.3,192,000 ක කුලී ආදායම ආදායමක් ලෙස හඳුනාගෙන ණය ගැතියන්ගේ ලැබිය යුතු මුදල් යටතේ දක්වා තිබුණද, මෙම මුදල අයකර ගැනීමේ අවිනිශ්චිතතාවයක් මතු වී තිබුණි. කෙසේ වෙතත්, ඒ සඳහා වූ අගය හායනය වීම ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා නොතිබුණි. තවද, 2015 වර්ෂයේ සිට මේ දක්වා එම ඒකකය විසින් පරිශ්‍රය භාවිතා කරන නමුත් කිසිදු කුලී මුදලක් අය කර නොතිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට ආයතනයට රු.25,536,000 ක මුළු කුලී ආදායමක් අහිමි වී තිබුණි.

9.2.3 නොසැසඳුණු ගිණුම් හෝ වාර්තා

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

අ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් සහ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයෙන් පිළිවෙළින් ලැබිය යුතු රු.4,004,519 ක් සහ රු.5,528,842 ක් වූ වෙළෙඳ ණයගැති ශේෂයන් එම ආයතන සමඟ සසඳා නොතිබූ අතර එම ප්‍රමාණයෙන්ම වෙනස්කම් නිරීක්ෂණය විය.

ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ශේෂය රු.5,396,778 ක් වූ අතර එය ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ගිණුම්වලට අනුව රු.6,512,810 ක් විය. ඒ අනුව රු.1,116,032 ක වෙනසක් නිරීක්ෂණය විය.

ඇ) සමාලෝචිත වර්ෂය සඳහා වූ ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය වෙත ගෙවිය යුතු මුදලක් නොතිබුණි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව ආයතනයෙන් ලැබිය යුතු රු.9,023,930 ක මුදලක් නිරීක්ෂණය විය.

ඈ) ආයතනයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ උපචිත වියදම් රු.35,013,397 ක් වී තිබුණි. විගණනයට ලබා දී තිබූ උපලේඛනයට අනුව එය රු.34,003,642 ක් වූයෙන් රු.1,009,755 ක වෙනසක් දක්නට ලැබිණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ *මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම* යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

9.3 ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් ආයතනයේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීම්යි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

9.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

9.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව හිඟුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

9.6 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

1. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

   1.1. මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සහ 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා ආයතනය පවත්වාගෙන ගොස් තිබුණි.

   1.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

   1.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2. අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

   2.1. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට ආයතනය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

   2.2. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/ විධානයට යොමුව		නිරීක්ෂණ
2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය		අත්තිකාරම් ලබා දී ඇති අරමුණ අවසන් වී දින 10ක් ඇතුළත පියවිය යුතු වුවද, අවස්ථා 58කදී ලබා දී තිබූ රු.3,736,366 ක් වූ මුළු අත්තිකාරම් ප්‍රමාණය පියවීම සඳහා දින 21 සිට දින 143 දක්වා ප්‍රමාදයක් නිරීක්ෂණය විය. තවද, පූර්ව අනුමැතියක් ලබා ගැනීමකින් තොරව රුපියල් 100,000 ක උපරිම අත්තිකාරම් සීමාව ඉක්මවා අවස්ථා 4 කදී රු.911,000 ක මුළු අත්තිකාරම් ප්‍රමාණයක් ලබා දී තිබුණි.
2021 නොවැම්බර් 16 දිනැති රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොත	i) 3.4 ඡේදයේ ix වන වගන්තිය	සුවිශේෂී තත්ත්වයන් යටතේ වැඩ බලන පත්වීමක් සිදු කරන්නේ නම්, එය වසරක් නොඉක්මවන කාලයකට සීමා කළ යුතුය. කෙසේ වෙතත්, ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යයන) තනතුර සඳහා 2020 දෙසැම්බර් 01 සිට 2022 ජූලි 04 දක්වා මාස 20 ක කාලයකට වැඩ බලන පත්වීමක් ලබා දී තිබුණි.
	ii) 3.4 ඡේදයේ x වන වගන්තිය	සෑම රජය සතු ව්‍යවසායයකටම අනුප්‍රාප්තික සැලැස්මක් තිබීම අවශ්‍ය වේ. කෙසේ වෙතත්, ආයතනය අද දක්වා අනුප්‍රාප්තික සැලැස්මක් සකස් කර නොතිබුණි.

2.3. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.4. 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ආයතනයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

3. වෙනත් කරුණු

අ) තොගවල අභ්‍යන්තර පාලන පද්ධතිය පවත්වාගෙන යාම සඳහා මේ දක්වා තොග කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දී නොතිබූ අතර තොග පාලන මට්ටම් ආයතනය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණි.

ආ) 2022 ලෝක සංචාරක දිනයට සමගාමීව ආහාර උත්සවයක් හඳිසි වැඩසටහනක් ලෙස නිසි පිරිවැය-ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව 2022 සැප්තැම්බර් 27 වන දින ආයතනය විසින් සංවිධානය කර පවත්වා තිබුණි.

ඇ) දීර්ඝ කාලයක් තිස්සේ ආයතනයේ ගබඩාවට ගබඩා භාරකරුවෙකු පත් කර නොතිබුණි. ඒ වෙනුවට තාවකාලික අධීක්ෂණ නිලධාරීන් කිහිප වතාවක්ම සේවයේ යොදවා තිබුණි. තවද, කාර්යාල කාර්ය සහයකවරුන් දෙදෙනකු ගබඩාවේ සේවයේ යොදවා තිබූ අතර මූල්‍ය අංශයේ පවත්වාගෙන යා යුතු ලෙජරය ඇතුළු සියලුම වාර්තා ඔවුන් භාරයේ තබාගෙන තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

ඈ) 2022 වර්ෂය තුළදී ණයගැතියන්ගෙන් මුදල් අයකර ගැනීම ඉතා මන්දගාමී වූ අතර විය වර්ෂය තුළ මුළු ණය ගැතියන්ගෙන් සියයට 3 ක් වූ අතර හිඟ මුදල් කාර්යක්ෂම හා ඵලදායී ලෙස අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. විකතුව රු. මිලියන 12ක මුදලක් වසර 08කට වැඩි කාලයක් තිස්සේ හිඟව පැවතුණි.

ඉ) 2014 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,452,439 ක් වූ ගෙවිය යුතු විකතු කළ අගය මත බදු සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

ඊ) 2014 දී තොරතුරු පද්ධතියක් සංවර්ධනය කිරීම සඳහා රු.2,262,730 ක මුදලක් වැය කර තිබූ අතර, ආයතනයේ අවශ්‍යතා සමඟ නොගැලපීම හේතුවෙන් එය අත්හැර දමා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේදී ද එම වටිනාකම නොනිමි වැඩ ගිණුමෙන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.

උ) 2011 වසරේ ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් ලැබුණු සහ සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආයතනය විසින් භාවිත කරනු ලබන රු. 2,200,000 ක් වටිනා වාහනයේ අයිතිය ආයතනය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඌ) භාණ්ඩ හා සේවා මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය අනුගමනය කිරීම වෙනුවට අවස්ථා 60කදී රු.4,199,160 ක මුදලක් අත්තිකාරම් ලෙස ලබා දී අදාල මිලදී ගැනීම් සිදු කර තිබුණි.

එ) ස්ථාවර වත්කම් සඳහා කේතීකරණ ක්‍රමයක් අද දක්වා හඳුන්වා දීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව ස්ථාවර වත්කම්වල අභ්‍යන්තර පාලන පද්ධතිය සම්බන්ධයෙන් විගණනයේදී සෑහීමකට පත් විය නොහැකි විය.

ඒ) 2009 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියෙන් භාර දුන් රු.860,000 ක් වටිනා වාහනය සමාලෝචිත වර්ෂය අවසානයේ දී විගණනයට භෞතිකව තහවුරු කර ගැනීමට නොහැකි විය.

ඔ) 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයෙන් අය විය යුතු රු.330,000 ක කුලී ආදායම මේ දක්වා අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඕ) සමාලෝචිත වර්ෂය අවසාන දිනට පැවති තැන්පතු සහ වෙනත් ලැබිය යුතු දෑ මුළු ශේෂය වූ රු.145,149,037 සඳහා ශේෂ තහවුරු කිරීම් ලැබී නොතිබුණි.

ක) පාරිතෝෂිත ගෙවීම සඳහා පවත්වාගෙන යන රු.17,365,170 ක ආයෝජනයක් ඒ සඳහා යොදා නොගෙන සාමාන්‍ය ඉතුරුම් ගිණුමක් ලෙස පවත්වාගෙන ගොස් තිබුණි. එය සමාලෝචිත වර්ෂය අවසානයට වූ මුළු පාරිතෝෂිත ප්‍රතිපාදනවලින් සියයට 30 ක් විය. තවද, ඉහත ආයෝජනය සාමාන්‍ය ඉතුරුම් ගිණුම් පොලියට වඩා වැඩි පොලියක් ලබා ගත හැකි ස්ථාවර තැන්පතු හෝ අවදානම් රහිත වෙනත් ආයෝජනයක යොදවා නොතිබුණි.

ග) ආයතනයේ පුස්තකාලය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කරන ලද රු.6,268,941 ක මුදලක් වසර 03 කට වැඩි කාලයක් ප්‍රාග්ධනීකරණය නොකර නොනිමි වැඩ ගිණුමේ දක්වා තිබුණි.

ත) මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතියකින් තොරව රු.1,454,631 ක බොල් ණය කපා හැර තිබුණි. තවද, අඩමාන ණය සඳහා වූ ප්‍රතිපාදනය සම්බන්ධයෙන් නැවත සලකා බැලිය යුතු බව නිරීක්ෂණය විය.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති